ශ්‍රී ලංකාවේ ගොවිජනපද ව්‍යාපාරයන් හි ඉඩම් බුක්ති ක්‍රමය, එහි වෙනස්වීම් හා අනාගත අයිතිය සම්බන්ධ අභියෝග

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි

සංක්ෂේපය

ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමටත් පෙර අවධියේ සිට ඇරඹූ ප්‍රධාන ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙළක් වූ ජනපදකරණ ක්‍රියාවලිය අරමුණු මෙන් ම ව්‍යුහාත්මක ලෙස ද මහත් වෙනස්කම්වලට භාජනය වූවකි. ජනපද ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් වැදගත් වන නීතිරීතීන් හා රෙගුලාසීන් මඟින් ඉඩම්ලාභී ගොවීන්ගේ අයිතිකාර බුක්තිය සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදූව ද එය වෙනස්කම්වලට භාජනය වෙමින් විවිධ බුක්ති ක්‍රම ඇති වී තිබේ. මෙම ලිපිය මඟින් ජනපද ව්‍යාපාරයන් හි සිදුව ඇති ඉඩම් බුක්තිකරණ වෙනස්වීම් මෙන් ම ඒ හා සමගාමී ව උද්ගතව ඇති ඉඩම් අයිතිය සම්බන්ධ අනාගත අභියෝග පිළිබඳ ව විමසා බැලේ. එකිනෙකට වෙනස් කාල වකවානුවල පිහිටවනු ලැබූ මහජනපද ව්‍යාපාර පහක් ඇසුරින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයනයක් ආශ්‍රයෙන් ලබාගත් තොරතුරුත් මීට පෙර ජනපද පදනම් කරගෙන මෙම විෂය හා සම්බන්ධයෙන් කර ඇති අධ්‍යයන තොරතුරුත් මෙම ලිපිය සැකසීමේ දී උපයෝගී කරගනු ලැබිණි. සොයාගැනීම්වලට අනුව පැහැදිලි වූයේ, ජනපද ඉඩම් කට්ටි ප්‍රමාණයෙන් මෙන් ම වපසරියෙන් ද සියයට හැටක් පමණ විවිධ අවිධිමත් බුක්ති ක්‍රමයන් යටතේ පවත්නා බවත් ඒවා අතර විවිධ බදු හා උකස් ක්‍රම ප්‍රධාන තැනක් ගන්නා බවත් ය. ජානපදිකයින් විසින් තම ඉඩම් වෙනත් අයට අවිධිමත් ලෙස පවරා දෙනු ලැබීමට හේතු වී ඇත්තේ පවුල් ශ්‍රමයේ හිඟකම හා වෙනත් රැකියාවන් හි නියුතු වීම නිසා වගා කිරීමට නො හැකි වීම, ජනපදයෙන් පිටස්තර ප්‍රදේශයක පදිංචි ව සිටීම හා හදිසි මූල්‍ය අවශ්‍යතා වැනි කරුණු ය. මෙම ක්‍රියාවලිය තුළ, ජනපදයන් හි ඉඩම් හිමි ධනවතුන් සුළුතරයක් අතර ඉඩම් ඒකරාශී වීමත් ඒ ඔස්සේ ඉඩම් හිමි පොහොසත් හා ඉඩම් අහිමි දුප්පත් යනාදී ලෙස කොට්ඨාස දෙකක් ඇති වීමත් සම්බන්ධයෙන් වූ අභියෝගයක් පෙනෙන්නට තිබුනත් වෙනස් වන්නා වූ සමාජ-ආර්ථික තත්ත්වයන් යටතේ එය ඊට වඩා වෙනස් ස්වරූපයක් ගෙන ඇති බව පෙනී යයි. වී වගාව ප්‍රමුඛ ආයෝජන කටයුතු සහිත ජනපද ප්‍රදේශයන් හි ශ්‍රමය කාර්යක්ෂම ව යෙදිය හැකි දුප්පත් ගොවීන්ට වඩාත් සාර්ථක ලෙස පැවැත්මට ඇති හැකියාව නිසා වඩාත් යහපත් සමාජ-ආර්ථික තත්ත්වයක් ඇති අයගේ ඉඩම් ද ඔවුන් විසින් බද්දට ගෙන කළමනාකරණය කිරීමේ ප්‍රවණතාවයක් ඇති ව තිබේ. ඒ හැරුණු කොට ජනපද ඉඩම් අවිධිමත් ලෙස පවුලේ සාමාජිකයින් අතර බෙදා ගැනීම නිසා ද දුප්පත් කුඩා ඉඩම් හිමියන්ගේ පැවැත්ම තහවුරු ව තිබේ. ස්ථිර අයිතියක් නොමැති අවිධිමත් බුක්ති ක්‍රම යටතේ පවත්නා ඉඩම් හි ඵලදායිතාවය වෙනුවෙන් දිගුකාලීන ව කරනු ලබන ආයෝජන නොමැති වීම ගැටළුවක් බැවින් ඒ සඳහා උනන්දු කරවීමේ ක්‍රමෝපායක් වශයෙන් අවිධිමත් ලෙස සැලකෙන බුක්ති ක්‍රම සඳහා යම්කිසි නීතිමය වලංගුභාවයක් ලබා දීමට ලිපියෙන් යෝජනා කෙරේ.

1. හැඳින්වීම

වියළි කලාපීය ජනශුන්‍ය ප්‍රදේශ එළිපෙහෙළි කරමින් නව ජලාශ හා වාරි පද්ධතින් ඉදිකරමින් හෝ කලින් ජනාවාස පැවති ප්‍රදේශවල පැරණි වැව් ප්‍රතිසංස්කරණය කර ඒ යටතේ ජනතාව පදිංචි කරමින් ගෙනයන ලද ජනපදකරණ ක්‍රියාවලිය මෙරට නිදහස ලබා ගැනීමටත් කලින් ඇරඹූ එහෙත් 20 වෙනි ශතවර්ෂයේ අවසාන දශකය පමණ දක්වාත් පැවති ප්‍රධාන ග්‍රාමීය සංවර්ධන ක්‍රමෝපායක් ලෙස හඳුන්වා දිය හැකි ය. ජනශුන්‍ය වියළි කලාපීය ප්‍රදේශ දියුණු කිරීම, තෙත් කලාපයෙ හි පැවති ජන පීඩනය අඩු කිරීම, කුඩා ඉඩම් හිමි ස්වාධීන ගොවියන් ආර්ථික වශයෙන් බලවත් ජන කණ්ඩායමක් ලෙස දියුණු කිරීම, ජීවන හා ආදායම් මාර්ග වර්ධනය කිරීම හා දේශීය ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම යනා දී මූලික අරමුණු කිහිපයක් සපුරා ගැනීම පෙරදැරි කොට ඇරඹූ ගොවි ජනපද වැඩපිළිවෙළ පසු කාලය වන විට ජල විදුලිය උත්පාදනය, කෘෂි පාදක කර්මාන්ත වර්ධනය හා අපනයන බෝග සංවර්ධනය යනා දී අරමුණු ගණනාවක් සපුරා ගැනීමේ බහුකාර්ය වැඩසටහනක් බවට පත්විය. මේ දක්වා මෙලෙස පිහිටුවා ඇති ගොවි ජනපද සංඛ්‍යාව 110 ද ඉක්මවා ගොස් ඇති අතර ඒ යටතේ අක්කර 4,17,620 ක් වූ ප්‍රමාණයක් ඉඩම්ලාභීන් 1,00,317 දෙනෙකු අතරේ බෙදා දී ඇත (ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, 2006).

බෙදා දිය හැකි ඉඩම් ප්‍රමාණය සීමා වීමත් සමඟ ජානපදිකයින් අතර බෙදා දී ඇති ඉඩම් කට්ටියක විශාලත්වය කාලීන වශයෙන් වෙනසකට භාජනය වී ඇත. ඒ අනුව මින්නේරිය, ගල්ඔය වැනි ව්‍යාපාරයන් යටතේ කුඹුරු ඉඩම් අක්කර 5 ක් හා ගොඩ ඉඩම් අක්කර 3 ක් ලෙස බෙදා දෙන ලද අක්කර 8 ක් වූ ප්‍රමාණය, පසු කාලයේ දී වරින් වර අඩු කර ඇත. උදාහරණ ලෙස, 1980 ගණන්වල මැද භාගයේ ඇරඹූ දූණුගම්වෙහෙර ව්‍යාපාරයේ දී බෙදා දී ඇත්තේ කුඹුරු ඉඩම් අක්කර 2 ක් හා ගොඩ ඉඩම් අක්කර 1/2 ක් එනම් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 2 1/2 ක් වශයෙනි. මෙම ඉඩම් පරිපාලනය 1935 ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව සිදුවන අතර එයට අනුව නිති පාලනය යටතේ පරිහරණය සඳහා ලබා දී ඇති බුක්තිය ආරක්ෂා කිරීම සඳහා (protected tenure) අවශ්‍ය නීතිරීතීන් හා රෙගුලාසීන් පවතී. ඒ අනුව ජනපද ඉඩම් බදු දීම, උකස් කිරීම, විකිණීම පමණක් නොව කොටස් කිරීම ද අවහිර කරමින් නීති පනවා ඇත. එහෙත් පසුව කරනු ලැබූ සංශෝධනයන් මඟින් කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් අක්කර 1 1/2 ක් සහ ගොඩ ඉඩම් සම්බන්ධයෙන් අක්කර 1/4 ක් යන සීමාවන්ට යටත් ව ඉඩම්ලාභීන්ගෙන් පැවතෙන්නන්ට එම ඉඩම් පැවරීම සඳහා කොටස් කිරීමට අවසර ලබා දී ඇත.

ඉහත දැක්වූ පරිදි ජනපද ඉඩම් නීතිමය රෙගුලාසි මඟින් ඉඩම්ලාභීන්ගේ බුක්තිය යටතේ තවදුරටත් පවත්වා ගැනීම සඳහා කෙතරම් උත්සාහ ගෙන ඇතත් විශේෂයෙන් ම ඒවායෙ හි ඇති කුඹුරු ඉඩම් විවිධාකාර වූ බුක්ති ක්‍රම යටතේ පවත්නා බව ප්‍රකට කරුණකි. ඉඩම් බුක්තිය යන්න මෙහි දී යම් ඉඩමක් සම්බන්ධයෙන් නීතිමය හෝ පාරම්පරාගත ලෙස අර්ථකතනය කර ඇති පරිදි එම ඉඩමට පෞද්ගලික ව හෝ කණ්ඩායමක් ලෙස ඇති සම්බන්ධතාවය අදහස් කෙරේ. බුක්තිය වූ කලී සමාජයීය නිර්මාණයක් වන අතර එමඟින් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට ඉඩම් අත්පත් කරගැනීම, භාවිතය,

කළමනාකරණය පමණක් නොව එය පැවරීම සම්බන්ධව ද ඇති හැකියාව නිර්වචනය කෙරේ. තවදුරටත් සඳහන් කරන්නේ නම්, ඉඩම් බුක්ති ක්‍රමය මඟින් ඉඩමක් කුමනාකාර කොන්දේසි යටතේ කොතරම් කාලයක් කවරෙකු විසින් භාවිතා කළ යුතු ද යන්න තීරණය කෙරේ (ආහාර හා කෘෂිකර්ම සංවිධානය, දාතම නොමැති). මින් අදහස් කෙරෙන්නේ යම් වකවානුවක හෝ ප්‍රදේශයක පවත්නා ඉඩම් බුක්ති ක්‍රමය හෝ ක්‍රමයන් එම වකවානුව හෝ ප්‍රදේශය නියෝජනය කරන සමාජයේ සමාජ, ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් හා අවශ්‍යතාවන් මත තීරණය වූවක් බව ය. මෙම ලිපිය ශ්‍රී ලංකාවේ ගොවිජනපද ව්‍යාපාරයන් හි ඉඩම් බුක්ති ක්‍රමයෙ හි වෙනස්වීම් කාලීන සමාජ ආර්ථික අවශ්‍යතාවන් හා කොතරම් සමීප වන්නේ ද යන්න හා ඒ ඔස්සේ මතු ව ඇති අනාගත අභියෝගතා පිළිබඳ ව විමසා බැලේ.

2. අරමුණු

ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයන් හි මෑතක් වන විට සිදු ව ඇති ඉඩම් බුක්තිකරණ වෙනස්කම් හා ඒ තුළින් මතු වී ඇති ඉඩම් අයිතිය හා සම්බන්ධ අනාගත අභියෝග පිළිබඳ ව විමර්ශනය කිරීම ලිපියෙ හි ප්‍රධාන අරමුණ වෙයි.

මෙහි සුවිශේෂ අරමුණු වන්නේ

01. ගොවි ජනපද ව්‍යාපාරයන් හි නීත්‍යානුකූල පැවරුම්ලාභීන් මූලික කරගත් තනි අයිතියට පිටස්තර ව පවත්නා ඉඩම් බුක්ති ක්‍රම හා ඒවායෙ හි ව්‍යාප්තිය හඳුනා ගැනීම.
02. එවැනි ඉඩම් බුක්ති ක්‍රම සඳහා හේතුකාරක වී ඇති සමාජ, ආර්ථික හා දේශපාලනික කරුණු විමර්ශනයට ලක් කිරීම.
03. විශාල ඉඩම් හිමියන් විසින් ඉඩම් ඒකරාශී කිරීමේ ක්‍රියාවලිය තුළ ඉඩම්ලාභී කුඩා ඉඩම් හිමියන් වියැකී යාමට ඇති ඉඩකඩ හා සම්බන්ධ ගැටළුව පිළිබඳ ව ගවේෂණය කිරීම.
04. ජනපද තුළ සුදුසු බුක්ති ක්‍රමයක් පවත්වා ගැනීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

3. ක්‍රමවේදය

මෙම ලිපිය සඳහා උපයෝගී කරගනු ලැබුයේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් තෝරාගත් ගොවි ජනපද 4 ක අවිධිමත් ඉඩම් ගනුදෙනු පිළිබඳ ව 2006 යල සහ 2006-2007 මහ කන්නය පදනම් කරගනිමින් කරනු ලැබූ ආනුභවික අධ්‍යයනයක (empirical study) තොරතුරු ය. එම අධ්‍යයනය පරාක්‍රම සමුද්‍රය, මහවැලි එච්, උඩවලව හා කිරිඳිඔය යන ගොවි ජනපද ව්‍යාපාර පදනම් කරගනිමින් කරනු ලැබූ අතර ඒ ඒ ජනපද ගොවි පවුල් නියෝජනය වන ආකාරයෙන් සසම්භාවී ලෙස තෝරාගත් පවුල් 571 ක් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් ද විවිධ බුක්ති ක්‍රම යටතේ ඉඩම් පරිහරණය කරන පවුල් ආශ්‍රයෙන් සිදු කළ සිද්ධි

අධ්‍යයන ආශ්‍රයෙන් ද ලබාගත් තොරතුරුවලින් සමන්විත වෙයි. ඊට අමතර වශයෙන් මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව ගොවි ජනපද ආශ්‍රයෙන් මීට කලින් සිදුකර ඇති අධ්‍යයන හා වාර්තා පරිශීලනය කිරීමෙන් ලබාගත් ද්විතියික තොරතුරු ද මෙම ලිපිය සැකසීමේ දී උපයෝගී කරගනු ලැබිණි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී සංඛ්‍යාත්මක වගු සටහන් හා ප්‍රස්තාර භාවිතයෙන් විස්තරාත්මක ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමය භාවිතයට ගනු ලැබිණි.

4. ප්‍රතිඵල හා සාකච්ඡා

4.1 අධ්‍යයන ප්‍රදේශයෙ හි පසුබිම

අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ ජනපද ව්‍යාපාරයන් ඉතිහාසයේ විවිධ වකවානුවල පිහිටුවනු ලැබූ හා විවිධ සමාජ – ආර්ථික, දේශපාලනික හා රාජ්‍ය ප්‍රතිපත්තීන්වල බලපෑම් හා අත්දැකීම්වලට මුහුණ දුන් ඒවා ය. ඒ අනුව ඒවායේ අරමුණු බෙදාදුන් ඉඩම් ප්‍රමාණය, පදිංචි කරවන ලද ජානපදිකයින්ගේ ස්වභාවය ඇතුළු වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් එකිනෙකට වෙනස්කම් පවතී. ඒ හේතුවෙන් ජනපද නියෝජනය කරන විවිධ ඉඩම් බුක්ති ක්‍රමයන් හි පූර්ණ චිත්‍රයක් මේ ඔස්සේ ලබාගත හැකි වේ.

අධ්‍යයනය සඳහා තෝරාගත් පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වන අතර 1930 දශකයේ අවසානයේ දී ප්‍රතිසංස්කරණය කොට විවිධ ප්‍රදේශවලින් තෝරාගත් ගොවි පවුල් පදිංචි කරවන ලද පැරණි එකකි. විවිධ ප්‍රදේශවලින් ඉඩම් කච්චේරි පවත්වා තෝරාගත් ජනතාව හැරුණු කොට, දෙවන ලෝක යුද්ධය සඳහා සහභාගී වූ යුද භටයන්ටත්, විවිධ සංවර්ධන කටයුතුවල නියැළි රජයේ සේවකයන්ටත් මේ යටතේ ඉඩම් ලබා දී ඇත. එක් පවුලක් සඳහා ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 5 ක් හා ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 3 ක් වෙයි. මේ වනවිට ජනාවාසය පිහිටුවා පරම්පරා ගණනක් ගත වී ඇති අතර තුන්වන පරම්පරාවේ සාමාජිකයෝ මේ වනවිට ඉඩම් පරිහරණය කරමින් සිටිති.

තවත් අධ්‍යයන ප්‍රදේශයක් වන කඩ්නම් මහවැලි සංවර්ධන වැඩසටහනට අයත් එච් කලාපයේ ජනතාව පදිංචි කරවා ඇත්තේ 1970 දශකයේ දී ය. කොත්මලේ වැව නිර්මාණය ඇතුළු තවත් මහවැලි ව්‍යාපාරයට ම අයත් සංවර්ධන කටයුතු නිසා ඉවත් කරන ලද අයටත්, එකිනෙක ඡන්ද කොට්ඨාස මට්ටමින් තෝරාගත් අයටත්, සංවර්ධනය කරන ප්‍රදේශය තුළ කලින් පදිංචි ව සිටි අයටත් මේ යටතේ ඉඩම් ලබා දී ඇත. එක් පවුලක් සඳහා ලබා දී ඇත්තේ මඩ ඉඩම් අක්කර 2 1/2 ක් හා ගොඩ ඉඩම් අක්කර 1/2 ක් වශයෙන් අක්කර 3 ක් වූ ඉඩම් ප්‍රමාණයකි. මෙහි බොහොමයක් ඉඩම් දෙවන පරම්පරාවේ දූ දරුවන් විසින් ද පාලනය කෙරේ.

අධ්‍යයනය සඳහා තෝරාගත් රත්නපුර දිස්ත්‍රික්කයට අයත් උඩවලව යෝජනා ක්‍රමය 1950 දශකයේ අවසාන භාගයේ දී අනවසරයෙන් අල්ලාගත් රජයේ ඉඩම්වල පදිංචි වූවන්ගේ අයිතිය තහවුරු කරලීම තුළින් ඇරඹුවකි. මහා ජලාශයක් ඉදිකොට ආරම්භ කරන ලද බහුකාර්ය යෝජනා ක්‍රමයක් වූ මෙම ව්‍යාපාරය මගින් විදුලි බලය

උත්පාදනය කිරීමට අමතර ව, වාණිජ බෝග වගාව හා ඒ ආශ්‍රිත ව කර්මාන්ත වර්ධනය කිරීම ද අපේක්ෂා කළ අතර අලුතෙන් පදිංචි කරවන ලද පවුල් වෙත විවිධ අවධින්වල දී විවිධ ඉඩම් ප්‍රමාණයක් ලබා දී ඇත. බොහෝ විට අක්කර 3 ක මඩ ඉඩමක් හා අක්කර 2 ක් හෝ 2 1/2 ක ගොඩ ඉඩමක් ලබා දී ඇත. මේ යටතේ ව්‍යාපාරයෙ හි ආරම්භය බොහෝ ඈතට යන නිසා බොහොමයක් ඉඩම් දෙවන හෝ තුන්වන පරම්පරාවෙ හි පාලනය යටතේ පවතී.

මේ යටතේ තෝරාගත් අනෙක් ජනපද යෝජනා ක්‍රමය වන කිරිදිඔය ව්‍යාපාරය 1980 ගණන්වල මැද භාගයේ දී ජානපදිකයින් පදිංචි කරවන ලද්දකි. රැකියා අවස්ථා වර්ධනය කිරීමට අමතර ව කෘෂි බෝග නිෂ්පාදනය නැංවීම අරමුණු කරගත් මෙම යෝජනා ක්‍රමය යටතේ එක් පවුලක් වෙත ලබා දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 3 ක් වන අතර එය මඩ ඉඩම් අක්කර 2 1/2 කින් හා ගොඩ ඉඩම් අක්කර 1/2 කින් සමන්විත ය. දකුණු පළාතේ ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ඉඩම් නොමැති ගොවි පවුල් අතරින් තෝරාගත් අය හා ව්‍යාපෘති ප්‍රදේශයේ කලින් පදිංචිව සිටියවුන් මේ යටතේ පදිංචි කරවා ඇති අතර බොහොමයක් ඉඩම් පළමු පරම්පරාවේ අය විසින් ම පාලනය කෙරේ.

4.2 ජනපදයන් හි වර්තමාන ඉඩම් බුක්ති ක්‍රම

අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරුවලට අනුව පැහැදිලි වූයේ ජනපද ප්‍රදේශයන් හි ඉඩම් පරිපාලනය හා සම්බන්ධ නීතිමය පදනම සැලසූ 1935 ඉඩම් සංවර්ධන ආඥා පනතට පිටස්තරව යමින් විවිධාකාර වූ ඉඩම් බුක්ති ක්‍රමයන් අධ්‍යයනය සිදුකළ ජනපද ප්‍රදේශයන් හි ක්‍රියාත්මක වූ බව ය. එම පනතට අනුව ඉඩම් කොටස් කිරීම, පැවරීම, විකිණීම, බදු දීම උකස් කිරීම යනා දී සියල්ල තහනම් විය. එහෙත් මේ සියල්ල අඩු වැඩි වශයෙන් අධ්‍යයනයට ලක් කළ විවිධ ජනපද ප්‍රදේශයන් ආශ්‍රයෙන් ක්‍රියාවට නැගිණි. මේ අනුව ජනපද ප්‍රදේශයන් හි පවත්නා ඉඩම් බුක්ති ක්‍රම විධිමත් හා අවිධිමත් ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. මීට කලින් සිදු කර ඇති අධ්‍යයනයන් අනුව ද ජනපද ප්‍රදේශයන් හි අවධිමත් ආකාරයට ඉඩම් කොටස් කිරීම (සඳරත්න, 1974, එල්මන් සහ තවත් අය, 1976) සහ අවිධිමත් ඉඩම් බුක්ති ක්‍රම සැලකිය යුතු ප්‍රමාණයකින් පැවතීම (ඉඩම් කොමිසම, 1985) වාර්තාගත කර ඇත.

අධ්‍යයනයට අදාළ ජනපද ප්‍රදේශයන් හි විධිමත් මෙන් ම අවිධිමත් ලෙස ක්‍රියාත්මක ඉඩම් බුක්ති ක්‍රමයන් වර්ගීකරණයට ලක්කළ අතර ඒ යටතේ හඳුනාගත් එම බුක්ති ක්‍රමයන් හි ස්වභාවය වගු අංක 01 හා වගු අංක 02 මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 01 : අධ්‍යයනය කළ ජනපද ප්‍රදේශයන් හි පැවති විධිමත් ඉඩම් බුක්ති ක්‍රමයන් හි ස්වභාවය

	බුක්ති ක්‍රමය	ලක්ෂණ
01.	නීතිමය අයිතිකරු විසින් ඉඩම් භාවිතය	ජනපද ආරම්භයේ ඉඩම්ලාභීන් ලෙස තෝරා නීතිමය ලෙස ඉඩමේ අයිතිය පවරාදුන් අය විසින් හෝ ඔවුන්ගෙන් පසු නීතිමය ලෙස ඉඩමේ අයිතිය පවරා දුන් අය විසින් ඉඩම භුක්ති විදීම.
02.	නීතිමය ලෙස මිල දී ගෙන භාවිතය	ඉඩම් සංවර්ධන ආඥා පනතට පසුව කරනු ලැබූ සංශෝධනයකට අනුව කොහෙත් ම වගා කිරීමට නො හැකි තත්ත්වයක් ඇති ඉඩම්ලාභීන්ගේ ඉඩම් ගොවිතැන වෘත්තියක් කරගත් අයට විකිණීමට අවසරය ලබාදීම යටතේ ඉඩම් මිල දී ගත් අය විසින් වගා කිරීම.
03.	නීතිමය අයිතිය ලබා නො ගත් උරුමකරුවන් විසින් භාවිතය	මුල් ඉඩම්ලාභීන් විසින් තමන්ගෙන් පසු එහි අයිතිකරුවන් ලෙස නම් කරන ලද එහෙත් මුල් ඉඩම්ලාභීන්ගෙන් තමන්ගේ නමට ඉඩම පවරා නො ගත් මුල් ඉඩම්ලාභීන්ගේ දරුවන් වැනි උරුමකරුවන් විසින් බුක්ති විදීම. මේ අය වර්තමානයේ ඉඩම් පරිහරණය සඳහා නීතිමය අයිතිය ලබා නො ගත්තවුන් වුව ද ඒ සඳහා අයිතිවාසිකම් කියයි.

වගු අංක 02 : අධ්‍යයනය කළ ජනපද ප්‍රදේශයන් හි අවිධිමත් ඉඩම් බුක්ති ක්‍රමයන් හි ස්වභාවය

	බුක්ති ක්‍රමය	ලක්ෂණ
01.	නීත්‍යානුකූල ඔප්පු නොමැති ව මිල දී ගත් ඉඩම් භාවිතා කිරීම.	වගා කිරීමට නො හැකි අයගෙන් හෝ තමන්ට ණය වී ගෙවා ගත නො හැකි වූ අයගෙන් ඉඩම් මිල දී ගෙන ඇති අතර ඒ සඳහා නීත්‍යානුකූල ඔප්පු නොමැත.
02.	නීත්‍යානුකූල ලියකියවිලි නොමැති ව ඉඩම් කැබලි කොට භාවිත කිරීම.	ඉඩම්ලාභියකු විසින් එක් දරුවකුට ඉඩම නීත්‍යානුකූල ව පවරා නොමැති විට සියළු දරුවන් ඒ සඳහා උරුමකම් කීම හේතුවෙන් පසුව එය කැබලි කරගෙන වගා කිරීමට පෙළඹේ. මෙසේ කැබලි කිරීමේ දී කුඹුරු ඉඩම් සඳහා අවම සීමාවක් පවතින අතර එය අක්කර 1 1/2 වෙයි. එහෙත් ඇතැම් තැනක ඊටත් වඩා කුඩා කැබලි ලෙස ඒවා වෙන්කරයි.
03.	නීත්‍යානුකූල ලියකියවිලි නොමැතිව ඉඩම් පොදුවේ භාවිතා කිරීම.	ඉඩම්ලාභියාගේ ද දරුවන් කිසිවකුට ඉඩම පවරා නොමැති විට සියළු දෙනා එයට අයිතිවාසිකම් කියන අතර සියළු දෙනා ම එකතු වී ඉඩම වගා කිරීම මේ යටතේ සිදුවේ.
04.	මුදල් මත බද්දට ගෙන බුක්ති විදීම.	නියමිත මුදල් ප්‍රමාණයක් ගෙවමින් කන්න කිහිපයකට හෝ වසර කිහිපයකට බදු ගැනීම මින් අදහස් කෙරේ. එම මුදල වගා කරන බෝගය මත ද ප්‍රදේශය මත ද වෙනස් වෙයි.
05.	වී බද්දට ලබාගෙන බුක්ති විදීම.	ජනපද ප්‍රදේශයන් හි වඩාත් ප්‍රචලිත අවිධිමත් බුක්ති ක්‍රමයක් වන මේ යටතේ නියමිත කන්නයක් වෙනුවෙන් වගා කිරීම සඳහා යම්කිසි ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් ප්‍රදේශයේ පිළිගත් වී අස්වනු ප්‍රමාණයක් ලබාදීම සිදු කෙරේ. සාමාන්‍යයෙන් කන්නයක් වෙනුවෙන් වී බුසලක් සඳහා බුසල් 15 ක් හෝ අක්කරයක් සඳහා බුසල් 30 ක් දීම සිදු කෙරේ. එහෙත් ඉඩමේ අස්වැන්න අනුව ගෙවන ප්‍රමාණය වෙනස් වෙයි. වීවලින් ගෙවීව ද අයිතිකරුගේ එකඟතාවය මත වෙනත් බෝග වගා කිරීමට වුව ද හැකියාව ඇත.
06.	උකසට ගෙන බුක්ති විදීම.	ඉඩමක් උකසට ගෙන ණය ලබාදීම උකස් ක්‍රමය වන අතර ඒ යටතේ ලබාගත් ණය මුදල සම්පූර්ණයෙන් ගෙවන තෙක් ඉඩම (පොලියක් ලෙස) බුක්ති විදීම සඳහා ණය ලබා දුන් පුද්ගලයාට අවස්ථාව ලැබේ. උකස් ක්‍රමය ද බොහෝ ජනපදවල ප්‍රචලිත බුක්ති ක්‍රමයකි.
07.	රාජ්‍ය හා පෞද්ගලික ඉඩම් අනවසරයෙන් බුක්ති විදීම.	ජනපදයන් හි පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම් මෙන් ම ඇළවල්, පාරවල් සඳහා වෙන් කරන ලද ඉඩම් ද පුද්ගලයන්ට බෙදා දී ඇති පදිංචියෙන් තොර ඉඩම් ද බලෙන් අත්පත් කරගෙන බුක්ති විදීම ජනපද ප්‍රදේශයන් හි ප්‍රචලිත වූවකි.

අධ්‍යයනය යටතේ අවධානයට ලක් කළ විවිධ ජනපද යෝජනා ක්‍රමයන් යටතේ විවිධ ප්‍රමාණයන් වාර්තා වුව ද සමස්තයක් ලෙස ගත් විට මුළු අධ්‍යයන ප්‍රදේශය ම නියෝජනය කළ සමස්ත නියැදියට අයත් ව පැවති මඩ ඉඩම් කට්ටිවලින් 60% ක් හා එම ඉඩම් කට්ටි ප්‍රමාණයෙන් 61% ක් 2006 යල කන්නය තුළදීත් ඉඩම් කට්ටිවලින් 61% ක් හා එම ඉඩම් ප්‍රමාණයෙන් 63% ක් 2006/2007 මහ කන්නය තුළදීත් අවිධිමත්

බුක්ති ක්‍රම යටතේ පැවතිණි. 2006/2007 මහ කන්නය තුළ දී අධ්‍යයන ප්‍රදේශය තුළ විධිමත් හා අවිධිමත් බුක්ති ක්‍රමයන් යටතේ ව්‍යාප්ත ව පැවති කුඹුරු ඉඩම් කැබලි හා ඒවායෙ හි ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක විස්තරයක් වගු අංක 03 න් ඉදිරිපත් කෙරේ.

වගු අංක 03 : අධ්‍යයන ප්‍රදේශයෙ හි තියැදි ගොවීන් විසින් විධිමත් හා අවිධිමත් බුක්ති ක්‍රම යටතේ වගා කරනු ලැබූ කුඹුරු ඉඩම් සංඛ්‍යාවෙ හි හා ප්‍රමාණයෙ හි ප්‍රතිශතය (2006/2007 මහ කන්නය)

අනු අංකය	බුක්ති ක්‍රමය	ඉඩම් භූමි ප්‍රමාණයෙ හි ප්‍රතිශතය	ඉඩම් කට්ටි සංඛ්‍යාවෙ හි ප්‍රතිශතය
විධිමත් ක්‍රම			
01.	නීතිමය අයිතිකරු විසින් භාවිතය	34.8	32.7
02.	නීතිමය ලෙස මිල දී ගෙන භාවිතය	2.5	3.0
03.	නීතිමය අයිතිය ලබා නො ගත් උරුමකරුවන් විසින් භාවිතය	1.4	1.7
උප එකතුව		**(38.7)**	**(37.4)**
අවිධිමත් ක්‍රම			
04.	නීත්‍යානුකූල ඔප්පු නොමැතිව මිල දී ගත් ඉඩම් භාවිතය	4.6	4.7
05.	නීත්‍යානුකූල ලියකියවිලි නොමැතිව ඉඩම් කැබලි කරගෙන භාවිතය	5.8	3.9
06.	නීත්‍යානුකූල ලියකියවිලි නොමැතිව ඉඩම් පොදුවේ භාවිතය	0.7	0.6
07.	මුදල් මත බද්දට ගෙන බුක්ති විඳීම	7.8	10.3
08.	වී බද්දට ලබාගෙන බුක්ති විඳීම	31.8	35.2
09.	උකසට ගෙන බුක්ති විඳීම	5.6	4.9
10.	රාජ්‍ය හා පෞද්ගලික ඉඩම් අනවසරයෙන් බුක්ති විඳීම	5.0	3.1
උප එකතුව		**(61.3)**	**(62.7)**
මුළු එකතුව		100	100

අධ්‍යයනයට අනුව 2006/2007 මහ කන්නයේ දී විධිමත් බුක්ති ක්‍රම යටතේ නියැදි ගොවීන් අත පැවති ලෙස වාර්තාගත වූ මුළු කුඹුරු ප්‍රතිශතය (37%) අතරින් වැඩි ම ප්‍රමාණයක් (මුළු කුඹුරු ප්‍රතිශතයෙන් 33%ක්) තවමත් නීතිමය අයිතිකරු එනම් ජනපදය ආරම්භ වූ අවස්ථාවේ ඉඩම් පැවරුම්ලාභී ගොවියා හෝ ඔහු විසින් පසු අයිතිකරු ලෙස නම් කරන ලද නීත්‍යානුකූල ව ඉඩම අත්පත් කරගත් අයෙකු විසින්

වගා කෙරේ. නියැදි ගොවීන්ගේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 2% කට ආසන්න ප්‍රමාණයක් නීතිමය අයිතිය ලබා නො ගත් උරුමකරුවන් විසින් වගා කෙරිණි. මුල් ඉඩම්ලාභීන් විසින් එම ඉඩම් අයිතිකරුවන් ලෙස නම් කරන ලද තම පවුලේ දරුවන් හෝ එසේ නම් නො කොට මිය ගිය අවස්ථාවන් හි ඉඩම් සංවර්ධන ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව පවුලේ වැඩිමල් දරුවන් එම ඉඩමෙ හි උරුමකරුවන් ලෙස සැලකෙන අතර එහෙත් එම උරුමය අනුව ඉඩමේ අයිතිය නියමිත බලධාරීන්ගේ මාර්ගයෙන් තමන්ගේ නමට පවරා නො ගෙන වගා කරන්නන් මේ යටතේ ගැනේ. මෙසේ ඉඩම් නීත්‍යානුකූල ව තම නමට පවරා නො ගත්ත ද මෙවැනි බුක්තිකරුවන් ඉඩම් වගා කිරීම සඳහා උරුමය ඇති අය බැවින් මෙවැන්නන් විධිමත් ඉඩම් බුක්තිකරුවන් ලෙස මෙහි දී සලකන ලදී. සියයට 3 ක් වූ ඉඩම් බුක්තිකරුවන් ප්‍රමාණයක් නීතිමය ලෙස මිල දී ගෙන භාවිතා කරන්නන් ලෙස සැලකෙන අතර මෙසේ මිල දී ගැනීම සඳහාත් නීතිමය මට්ටමින් අවස්ථාව සලසා ඇත. රජය මඟින් තෝරා ඉඩම් පවරන ලද ඉඩම්ලාභීන්ගෙන් ඇතැම් අයට සමහර අවස්ථාවල දී රෝගාතුර වීම හෝ වෙනත් කරුණු හේතුවෙන් තම ඉඩම කෙසේවත් සංවර්ධනය කළ නො හැකි අවස්ථාවල දී ගොවියකු ලෙස ජීවිකාව ගෙනයා හැකි අයෙකුට එය විකිණීම සඳහා අවස්ථාව සලසා ඇත.

අධ්‍යයනයට භාජනය කළ ජනපද ව්‍යාපාරයන් හි පැවති අවිධිමත් ඉඩම් බුක්ති ක්‍රම අතර ඉඩම් ගනුදෙනු මාර්ගයෙන් අයිතිකරු විසින් වෙනත් අයට වගා කිරීම සඳහා ඉඩම් පැවරීම තුළින් හටගත් ඒවාට ප්‍රමුඛ තැනක් හිමි වේ. ඒවායෙ හි ව්‍යාප්තියෙ හි වැදගත්කම අනුව පිළිවෙළින් වී බදු, මුදල් බදු හා උකස් යනාදී ක්‍රම එවැනි පැවරීමේ ගනුදෙනු ඇසුරින් හටගත් අවිධිමත් බුක්ති ක්‍රම වේ. මේවා යටතේ ඉඩම්ලාභියා හෝ අයිතිකරු විසින් කන්නයක් හෝ කිහිපයක් සඳහා ලබා දිය යුතු මුදල හෝ අස්වනු ප්‍රමාණය, වගා කළ යුතු බෝග යනාදිය සම්බන්ධයෙන් ඉඩම් ලබා ගන්නා සමඟ ගිවිසුමකට එළඹ ඇත. මුල් අයිතිකරුවන් සිටිය දී ම හෝ ඔවුන්ගේ මරණින් පසු පවුලක සිටින සියලු දරුවන් දෙමාපියන්ට ලැබුණු ජනපද ඉඩම් සඳහා අයිතිවාසිකම් කීම හෝ දෙමාපියන් විසින් එය සියලු දරුවන්ට පොදුවේ උරුම කරදීමට තැත් කිරීම නිසා ජනපද ඉඩම් නීත්‍යානුකූල නො වන අයුරින් කොටස් කර හෝ එසේ කොටස් නො කර පොදුවේ භාවිතය සාමාන්‍යයෙන් දක්නට ලැබෙන දෙයක් බව අධ්‍යයනයේ දී නිරීක්ෂණය විය. මේ හේතුව නිසා අවධානයට භාජනය කරනු ලබන 2006/2007 මහ කන්නය තුළ දී නියැදි ගොවීන් වගා කළ කුඹුරු ප්‍රමාණයෙන් සියයට 5 ක් පමණ එසේ කැබලි කළ ඉඩම් වූ අතර සියයට 4 ක් පමණ හවුලේ වගා කළ ඒවා විය.

4.3 විවිධ බුක්ති ක්‍රම යටතේ ඉඩම් පවරාදීමට පාදක වූ හේතු

නියැදි ගොවීන්ගේ ඉඩම්වලින් සියයට 35 ක් වී බදු ක්‍රමය යටතේත් 10% ක් මුදල් බදු ක්‍රමය යටතේත් 5% ක් උකස් ක්‍රමය යටතේත් ක්‍රියාත්මක විය. මේ අනුව සමස්ත නියැදි ගොවීන්ගේ කුඹුරු ඉඩම්වලින් සියයට 50 ක් ම අයිතිකරුවන් විසින් වෙනත් අයට වගාව සඳහා පවරනු ලැබ ඇති බැව් පැහැදිලි වේ. මෙය ජනපද ඉඩම් පරිපාලනය හා සම්බන්ධ නීතිරීති හා රෙගුලාසිවලට මුළුමනින් ම විරුද්ධව යාමකි. ඉඩම්ලාභීන්ගේ දිගුකාලීන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය නීතිරීති හා රෙගුලාසීන් පනවමින්

සෞභාග්‍යයෙන් ආඪ්‍ය වූ කුඩා ගොවිජන පන්තියක් බිහි කිරීම සඳහා රජය දරනු ලැබූ උත්සාහයට පිටුපාමින් ඉඩම්ලාභීන්ගේ ඉඩම්වලින් හරි අඩක් පමණ (මෙම ප්‍රමාණය ජනපදයෙන් ජනපදයට අඩුවැඩි වන අතර මෙහි දී ඒ පිළිබඳ ව හුවා දැක්වීමට උත්සාහ නො කෙරේ) වගාව සඳහා ඔවුන් විසින් ම වෙනත් අයට පවරා දීමට මූලික වූයේ කුමන හේතු ද යන්න ගැඹුරින් විමසා බැලිය යුතු ය. මේ සඳහා ඉඩම්ලාභීන් හෝ අයිතිකරුවන් සඳහා හේතු වූ කරුණුවලට අමතර ව එම ඉඩම් පවරා ගන්නන් ඒවා පවරා ගැනීමට පෙළඹ වූ කරුණු ද ඇති අතර මෙම ක්‍රියාවලියෙ හි යථාර්ථය හඳුනා ගැනීම සඳහා එම දෙයාකාරයෙන් ම වූ කරුණු සම්බන්ධයෙන් විමසා බැලීම වැදගත් වේ. අධ්‍යයන නියැදියෙ හි සිටි තම ඉඩම් බදු සහ උකස් ක්‍රමයට වෙනත් අයට වගා කිරීම සඳහා පවරා දුන් ඉඩම් හිමි ගොවීන්ට එසේ පවරා දීමට හේතු වූ මූලික කරුණු පිළිවෙළින් වගු අංක 04 සහ වගු අංක 05 මඟින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 04 : නියැදිය සඳහා තෝරාගත් ජනපද ඉඩම්ලාභී ගොවීන්ට තම ඉඩම් වෙනත් අයට බදු දීම හා උකස් කිරීම සඳහා බලපෑ හේතු

	හේතුන්	මෙම හේතුන් බලපෑ ගොවීන්ගේ ප්‍රතිශතය	
		බදු දුන් ගොවීන්	උකස් කළ ගොවීන්
01.	පවුලේ ශ්‍රමය හිඟකම.	69	19.4
02.	හදිසි මුදල් අවශ්‍යතා.	12	51.6
03.	ප්‍රදේශයෙන් පිටත ජීවත්වීම නිසා වගා කිරීමේ අපහසුව.	5	6.5
04.	නිවාස සෑදීම/අළුත්වැඩියා කිරීම සඳහා මුදල් අවශ්‍ය වීම.	-	6.5
05.	ඉඩම් දේවාලයකට අයත් ඒවා වීම.	5	-
06.	උකස්කරු/බදුකරු වෙනස් කිරීමේ අවශ්‍යතාව හෝ ඉඩම් වැඩිමුදලකට උකස් කිරීම.	1	6.5
07.	වෙනත් හේතු.	8	9.5
	එකතුව	100	100

වගු අංක 04 ට අනුව වගා කිරීම සඳහා පවුලේ ශ්‍රමය නොමැතිකම ඉඩම් බදු දීම සඳහා මූලික කරුණ වී ඇත. ඒ අනුව තම ඉඩම් මුදල් හෝ වී බදු ක්‍රමයට දුන් අයගෙන් 69% ක් ම එසේ දී ඇත්තේ මෙම හේතුව නිසා ය. වගු අංක 04 ට අනුව තම ඉඩම් උකස් කළ අයගෙනුත් සියයට 19 කට එසේ ඒවා උකස් කිරීම සඳහා බලපා ඇත්තේ එම කාරණයම ය. වර්තමානයෙ හි රටෙහි අනෙක් ප්‍රදේශයවල මෙන් ම ගොවි ජනපද ප්‍රදේශයන්හිත් දරුවන් සීමා කිරීම ආදී වූ කරුණු නිසා සුළු සාමාජිකයින් ගණනකින් යුත් කුඩා පවුල් බිහිවීම මෙම කාරණය හා බෙහෙවින් අනුබද්ධ වේ. එසේ සුළු සාමාජිකයින් ප්‍රමාණයක් සිටීමෙන් වී වගාව වැනි ශ්‍රමය බෙහෙවින් අවශ්‍ය කාර්යයක් සඳහා සම්බන්ධ වීමට හැකි ශ්‍රමිකයින් හිඟ වේ. අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරුවලට

අනුව තම ඉඩම් බදු හෝ උකස් ක්‍රමයට වගාව සඳහා පිටතට දුන් තියැදි ගොවි පවුල්වලින් 10% ක ම ශ්‍රම බලකායට අයත් (ශ්‍රම බලකාය ලෙස වයස 10-65 සලකන ලදී) එක සාමාජිකයෙකු හෝ නො සිටි අතර 38% කට එක් සාමාජිකයෙකු පමණක් සිටියහ. පවුල්වලින් 26% ක සාමාජිකයින් දෙදෙනෙක් පමණක් සිටියහ.

පවුල්වල ශ්‍රම බලකායට අයත් එක් අයෙකු හෝ නො සිටීමට හේතුව ඉඩම් ලාභියා/ලාභිනිය හෝ ඔහුගේ බිරිඳ /ස්වාමි පුරුෂයා වයස 66 ඉක්මවා සිටීම හැරුණු කොට ඔවුන්ට කොහෙත් ම දරුවන් නොමැති වීම හෝ සිටින දරුවන් විවාහ වී පවුලින් වෙන්වී සිටීම ය. ඇතැම් පවුල්වල ශ්‍රම බලාකයට අයත් දෙදෙනෙකු හෝ කීපදෙනෙකු සිටියත් වී වගාව වැනි වැඩි මහන්සියකින් කළ යුතු කාර්යයන් හි තියැලීමට විශේෂයෙන් තරුණ පරම්පරාව තුළ මැලිකමක් තිබීමත් ආකර්ශනීය ආදායමක් නො ලැබෙන කෘෂිකර්මයෙ හි තියැලීමට ගොවි ජනපදයන් හි දෙවන හා තුන්වන පරම්පරාවන් හි සාමාජිකයන් තුළ මැලිකමක් තිබීමත් (චන්ද්‍රසිරි, 2010) කුඹුරු ගොවිතැන් සඳහා ශ්‍රමය ප්‍රමාණවත් ව නො තිබීම කෙරෙහි බෙහෙවින් බලපා ඇත.

ඉඩම් බදු දීම සඳහා මිළහට වැඩි වශයෙන් බලපා ඇත්තේ හදිසි අවශ්‍යතාවක් සඳහා මුදල් අවශ්‍ය වීම ය. තියැදියෙ හි සිටි ඉඩම් බදු දුන් අයගෙන් 12% ක් ඉඩම් බදු දීම සඳහා හේතුව ලෙස එය දක්වා තිබුණි. එහෙත් ඉඩම් උකස් කළ අයගෙන් වැඩි ප්‍රමාණයක් (එනම් 51% ක්) එය ප්‍රධාන හේතුව ලෙස සඳහන් කළහ. බොහෝ විට උකස් ගනුදෙනු කරන්නේ රෝගාබාධයක්, පිටරට රැකියාවකට යාමක් හෝ තවත් ණය මුදලක් ගෙවීමට සිදුවීම වැනි කාරණයක් නිසා හදිසියේ ඇතිවන මුදල් අවශ්‍යතාවයක් සපුරා ගැනීම සඳහා ය. ඉඩම් උකස් කළ ගොවීන්ගෙන් 6% කට පමණ එසේ උකස් කිරීමට හේතුව ලෙස නිවාස සෑදීමේ කටයුත්ත සඳහා ආයෝජනය කිරීමට මුදල් අවශ්‍ය වීම බලපා තිබුණි.

කුඹුරු ඉඩම් බදු දීමට මෙන් ම උකස් කිරීමට ද එක හා සමාන ලෙස බලපා ඇති කරුණක් වූයේ (බදු දුන් අයගෙන් 5% කට හා උකස් කළ අයගෙන් 6% කට) ඉඩම්ලාභී අයිතිකරු ප්‍රදේශයෙන් පිටස්තරව ජීවත් වීම යි. මෙය බොහොමයක් ජනපදවල ඉඩම් බදු හෝ උකස් දීම සඳහා ප්‍රචලිත ලෙස බලපා ඇති කාරණයක් වී ඇත. මෙම ගැටළුව ඉඩම්ලාභීන් ලෙස ජානපදිකයින් තෝරා ගැනීමේ දී අනුගමනය කර ඇති ක්‍රියාමාර්ගයෙ හි ඇති අඩුපාඩුකම් සමඟ ද සම්බන්ධ වෙයි. උදාහරණ ලෙස මෙම අධ්‍යයනය යටතේ ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමේ දී ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ කළ සාකච්ඡාවන් හි දී අනාවරණය වූයේ මහවැලි ව්‍යාපාරය යටතේ චන්ද කොට්ඨාස මට්ටමින් තෝරාගත් ජානපදිකයින් අතර ගොවිතැන පිළිබඳ ව අත්දැකීමක් නොමැති දේශපාලනික හිතවත්කම මත තෝරාගත්තවුන් සිටි නිසා එවැනි අය බොහොමයක් ජනපදයෙ හි පදිංචි නොවී වෙනත් අයෙකුට ඉඩම පවරා තම මුල් ගමෙ හි පදිංචි ව සිටින බව ය. මෙපරිද්දෙන් ම කිරිදිඔය ව්‍යාපාරය යටතේ ජානපදිකයින් ලෙස තෝරාගත් ධීවර රැකියාව තම ප්‍රධාන අදායම් මාර්ගය කරගත් අය ද ඉඩම බදු හෝ උකස් ක්‍රමයට වෙනත් අයෙකුට පවරා තම මුල් ගම්වල ම පදිංචිව පුරුදු රැකියාව කරගෙන යති. පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය හා සම්බන්ධ වූ යුද හටයින්ගෙන් පැවතෙන්නේ

ද එසේ නාගරික ප්‍රදේශයන් හා වැඩි සම්පත්වයක් දක්වන්නන් නිසා තම කුඹුරු ඉඩම් වගාව සඳහා වෙනත් අයට ලබා දීමට වැඩි නැඹුරුතාවක් දැක්වූහ. මීට අමතර ව ඉඩම් බදු දීම සඳහා ඇතැම් ඉඩම් පංසල් ඉඩම් වීම යන කාරණය (5% කට ඉඩම් උකස් කිරීම සඳහා මෙය හේතු වී ඇත), කලින් සිදුකර ඇති උකස් බේරීමට සිදුවීම (6% කට මෙය බලපා ඇත) යන කාරණා මේ සම්බන්ධයෙන් වැදගත් හේතූන් ලෙස සැලකිය හැකි ය.

ගොවි ජනපදයන් හි ඉඩම් සම්බන්ධයෙන් සාම්ප්‍රදායික ගම්වල පවත්නා බුක්ති ක්‍රමයට වෙනස් ආකාරයේ වූ බුක්ති ක්‍රමයක් පවත්වා ගැනීම සඳහා නීතිරීතිත් පැනවුව ද එබඳු සම්ප්‍රදායික බුක්ති ක්‍රම තවදුරටත් ඒවායෙ හි ක්‍රියාත්මක වෙයි (වනිගරත්න, 1995). ජනපද ඉඩම් අයිතිය හා සම්බන්ධ නීතිරීතිවලට අනුව ජනපද ඉඩම්ලාභියා විසින් නම් කරන අයෙකු හෝ එසේ නම් නො කොට මියගිය විට ඔහුගේ පවුලේ වැඩිමල් පිරිමි දරුවා (මෑතක දී මෙය වැඩිමල් ගැහැනු දරුවන් සඳහා ද වලංගු වන ලෙස සංශෝධනය කර ඇත) අයිතිකරු ලෙස සැලකෙයි. එසේ වුව ද සාම්ප්‍රදායික ගම්වල රෝම ලන්දේසි නීතිය අනුව පවුලේ සියළු දූ දරුවන්ට සමව පාරම්පරික දේපළ උරුම වන නිසාත් දෙමාපියන් සිටිය දී වුව ද එක් අයෙකුට හෝ කීපදෙනෙකුට පමණක් දේපළ පවරා දීමට හැකියාව තිබියදීත් සියළු දෙනාට ම සමව ලබා දීම තම යුතුකමක් ඉටුකළා වැනි හැඟීමක් ඇති කරගැනීමට සමාජය තුළින් දෙමාපියන් හුරුකර ඇති නිසාත් ජනපද ප්‍රදේශයන්හි දෙමාපිය අනුදැනුම ඇතිව හෝ නැතිව (ඔවුන්ගේ මරණින් පසු) ජනපද ඉඩම් එසේ සමව බුක්ති විඳීමට පවුලේ සාමාජිකයෝ පෙළඹී සිටිති. ඉඩම සම කොටස්වලට කඩා වෙන්කර ගැනීමෙන් හෝ එකතුව හවුලේ වගා කිරීම තුළින් මෙම අවශ්‍යතාව සපුරා ගැන්මට ජනපදලාභීහු පෙළඹී සිටිති.

පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය යටතේ කුඹුරු අක්කර 5 ක් වැනි විශාල ප්‍රමාණයක් ලබා දී ඇති නිසා බෙදිය හැකි අඩුම ඉඩම් සීමාවට අනුකූල වන පරිදි (කුඹුරු ඉඩම් සම්බන්ධ අක් 1 1/2 කි) දරුවන් තිදෙනෙකු අතර බෙදීමට හැකියාව තිබුණි. එහෙත් මහවැලි හා කිරිඳිඔය ව්‍යාපාර යටතේ බෙදා දී ඇති කුඹුරු ප්‍රමාණය අක්කර 2 1/2 ක් නිසා අදාළ නීතිමය රෙගුලාසීන්වලට අනුව දෙදෙනකු අතරේවත් කොටස් කර බෙදා දීමට හැකියාව නොමැත. එසේ වුව ද නීතියට පිටස්තරව ජනපදවාසීහු එම ඉඩම් කුඩා කොටස් ලෙස බෙදාගෙන වගා කරන අතර ඇතැම් අවස්ථාවල හවුලේ ද වගා කරති. මේ ආකාරයට අධ්‍යයනයට අදාළ නියැදි ගොවීන් විසින් කොටස් වශයෙන් බෙදා ගැන්මෙන් හා එකතුව වගා කරන ඉඩම් ප්‍රමාණය 5% ක් පමණ වෙයි.

නීතියට පිටස්තර ව මිල දී ගත් ඉඩම් මෙන් ම අනවසරයෙන් අල්ලාගත් ඉඩම් භාවිතයත් ජනපදයන් තුළ සැලකිය යුතු ප්‍රමාණයක් පවතී. මෙම අධ්‍යයනයට අනුව එසේ මිල දී ගෙන භාවිතා කරන ඉඩම් ප්‍රමාණය 5% ක් වන අතර අනවසරයෙන් බුක්ති විඳින ඉඩම් ප්‍රමාණය 3% ක් වෙයි. මේ ආකාරයට මිල දී ගෙන ඇත්තේ බොහෝ විට ණය වී බංකොලොත්භාවයට පත් වූ ඉඩම්ලාභීන්ගේ ඉඩම් ය. ඉඩම් උකස් කර බේරා ගැනීමට අපහසු වීම නිසා ඒවා විකුණන ලද අවස්ථා අධ්‍යයනයේ දී අත්දැකිය හැකිවිය. අනවසරයෙන් අල්ලාගත් ඉඩම් අතරට රාජ්‍ය මෙන් ම පෞද්ගලික ඒවාත් අයත් වේ. යම්

යම් කාර්යයන් සඳහා වෙන් කරන ලද රාජ්‍ය ඉඩම් හැරුණු විට පුද්ගලයින් පදිංචියට නො පැමිණි ජනපද ඉඩම් ද ටික කලකට වගා කිරීම සඳහා අවසරය ලබාගත් එහෙත් අඛණ්ඩ ව බලෙන් බුක්ති විඳින ඉඩම් ද මෙයට ඇතුලත් වේ.

ඉඩම්ලාභීන්ගේ ඉඩම් අවිධිමත් ලෙස වෙනත් අයට පැවරීම සඳහා ඔවුන් පෙලඹවීමට මෙන් ම පිටස්තරින් එම ඉඩම් ලබා ගැන්ම සඳහා උද්යෝගයක් දැක්වීමට බලපෑ කරුණු කිහිපයක් ඇත. මින් එක් කාරණයක් වූයේ පැවති සමාජ ආර්ථික තත්ත්වයන් හමුවේ වී වගාව කුඩා ඉඩම් කැබලි යටතේ සිදු කරනවාට වඩා නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය යටතේ පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිතා කරමින් (කැබලි කීපයක් එක්කල) විශාල ඉඩම්වල සිදු කිරීම ඵලදායී ව පවත්වා ගැනීමට මෙන් ම වැඩි ලාබයක් ලබා ගැන්මට හේතු වීම යි. උදාහරණ ලෙස මහවැලි ව්‍යාපාරය යටතේ අක්කර 2 1/2 ක කුඹුරු ඉඩම වගා කිරීම තුළින් හොඳ අස්වනු තත්ත්වයක් යටතේ වුව ද කන්නයක දී ලබාගත හැකි වූයේ රු.25,000 ක පමණ ශුද්ධ ආදායමක් පමණි. වෙනත් ආදායම් නොමැති පවුලකට මෙය ජීවත්වීම සඳහා පවා ප්‍රමාණවත් නො විණි. එනිසා පවුලේ ශ්‍රමය වඩාත් ඇති ගොවි පවුල් විසින් ඉඩම් කීපයක් වී බද්දට ලබා ගැන්මෙන් පවුලේ ශ්‍රමය මෙන් ම තමන් සතු ලෑන්ඩ්මාස්ටරය හෝ වෙනත් ට්‍රැක්ටරයක ආධාරයෙන් නිෂ්පාදන වියදම අඩු කිරීමෙන් එය ලාබදායී ව පවත්වාගෙන යාමට හැඩගැහී තිබුණි. එම කාරණය ඇතැමුන් තම ඉඩම් පිටස්තර අයට දීමට මෙන් ම තවත් අයකු එවැනි ඉඩම් ලබා ගැන්මට පෙලඹවීමට සමත් කරවිය. සිද්ධි අධ්‍යයන 01 මගින් මෙම කරුණ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

සිද්ධි අධ්‍යයන : 01

මහවැලි එච් කලාපයේ කැලේගම කෘ.ප.නි.ස. වසමට අයත් ගහසිරිපුර පදිංචි ගාමිණී කුලතුංග ගොවි මහතා කුණ්ඩසාලයෙන් පැමිණ ඉඩම්ලාභියෙකු ලෙස පදිංචි වූ තම පියාට අයත් ඉඩමෙ හි පදිංචිව සිටී. ගොඩ ඉඩම් අක්කර 1/2 ක් පමණක් නොව කුඹුරු ඉඩම් අක්කර 2 1/2 හි ද පැවරුම්කරු ඔහු වී ඇත. ප්‍රධාන රකියාව ලෙස ගොවිතැනෙ හි ම නියැළී සිටින ඔහුට පිරිමි ළමුන් 3 දෙනෙකු හා ගැහැනු ළමුන් දෙදෙනෙක් ද සිටිති. ගොවි සංවිධානයේ ජල කළමනාකරු ලෙස සේවය කරන මොහුට ඒ කාර්යය සඳහා ද රු.5,000 ක මුදලක් මාසික ව ලැබේ. ජීවත් වීම සඳහා සැලකිය යුතු ආදායමක් උපයා ගැනීම සඳහා ඔහු තම ඉඩමට අමතර ව තවත් කුඹුරු ඉඩම් දෙකක් ද බදු ක්‍රමයට ගෙන වගා කරයි. මින් එක් කුඹුරක් (අක්කර 2 1 /2) තම භාර්යාවගේ මවට අයත් එකකි. ඇයගේ සැමියා මරණයට පත් වී ඇති අතර පුත්‍රයා සතු ව වෙනත් ඉඩමක් තිබේ. ඇයට අයත් අක්කර 2 1/2 ගෙදර පදිංචිව සිටින ආබාධිත දියණිය වෙනුවෙන් වෙන්කර ඇතත් වගා කරගැනීමට ඇති නො හැකියාව නිසා එය කුලතුංග මහතා වී බද්දට වගා කිරීම සඳහා පවරා ඇත. ඒ වෙනුවෙන් ඔහු මහට වී බුසල් 60 ක් හා යලට වී බුසල් 25 ක් දෙයි. තම කුඹුරු ඉඩමට අමතර ව බද්දට ගත් ඉහත දැක්වූ කුඹුර හා තවත් කුඹුරක් ඇතුළත් ඉඩම් අක්කර 7 1/2 ක් වගා කරන කුලතුංග මහතා තමන් සතු අත් ට්‍රැක්ටරය, ජලය පොම්ප කිරීම් යන්ත්‍රය හා ස්ප්‍රේ යන්ත්‍රය මෙන් ම භාර්යාව හා දරුවන්ගේ ශ්‍රමය වඩාත් කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් අදාළ ඉඩම්වලින් උපරිම ආදායමක් ලබා ගැනීමට කටයුතු කරයි. ඒ අනුව 2006/2007 මහ කන්නයේ දී ඔහු වී අක්කර 6 ක් ද, සෝයා බෝංචි අක්කර 1 ක් ද බී ලූණු අක්කර 1/2 ක් ද වගා කර තිබුණි. මෙවැනි වාණිජ බෝග වගා කිරීමේ දී ඒවා මිල දී ගන්නා සමාගම් සමඟ ඉදිරි වෙළෙඳ ගිවිසුම් ද ඇති කරගෙන ඇත.

ජනපද ඉඩම් බදු හෝ උකස් ක්‍රමයට ලබා ගැන්මෙන් වාණිජ බෝග වගා කර ලාබ ලබන ව්‍යාපාර පන්තියක් බිහිවීමත් ඒවා තුළින් ජනපද ඉඩම් අවිධිමත් ලෙස ලබා ගැන්ම සඳහා දැඩි ඉල්ලුමක් පැවතීමත් අවිධිමත් ඉඩම් ගනුදෙනු සඳහා යම්කිසි බලපෑමක් ඇති කර ඇත. විශේෂයෙන් ම කෙසෙල්, ගස්ලබු හා එළවළු (සෝයා, වම්බටු යනාදිය) වගාව අධ්‍යයනය සඳහා තෝරාගත් ජනපදයන් හි වඩාත් ප්‍රචලිත වගාවන් බවට පත්ව ඇත. මෙවැනි වාණිජ වගාවන් සඳහා මෙසේ ඉඩම් ලබාගන්නන් අතර ව්‍යාපාරික හැකියාවන් ඇති තරුණයින්, කඩ හිමියන්, වී මෝල් හිමියන්, ජනපදය තුළින් ම බිහිවූ දක්ෂ ගොවීන් මෙන් ම වෙනත් ආකාරයේ ආයෝජකයෝ ද සිටිති. සිද්ධි අධ්‍යයන 2 මඟින් මෙම කරුණු පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැක.

සිද්ධි අධ්‍යයන : 02

ජේ. චමින්ද ප්‍රියදර්ශන කිරිදිඹය ව්‍යාපාරය යටතේ බෙරලිහෙළ පදිංචි තරුණ ගොවියකු වන අතර පියාගෙන් තමන්ට උරුම වූ අක්කර 2 1/2 ජනපද ඉඩමට අමතර ව වරින්වර බද්දට ලබාගත් ඉඩම් වඩාත් එලදායී ලෙස කෙසෙල් හා එළවළු වගාව සඳහා භාවිතා කරමින් සැලකිය යුතු මට්ටමක දියුණුවක් ලබා ඇත. ඔහු විසින් 2006 වසරේ දී රුපියල් ලක්ෂ 3 ක් දී අක්කර 5 ක් බද්දට ගෙන ඇති අතර තවත් අක්කරයක් රු. 175,000 කටත් තවත් අක්කරයක් රු. 200,000 කටත් බදු ගෙන ඇත. මීට අමතර ව සින්නක්කර ලෙස ලබාගත් අක්කර 2 ක් පමණ වූ ඉඩම් කැබලි දෙකක් ද ඇත. මෙම ඉඩම්වල වැඩි වශයෙන් කෙසෙල් වගා කර ඇති අතර මසකට රු.10,000 බැගින් පඩි ගෙවමින් කම්කරුවන් දෙදෙනෙකු නවතාගෙන ඔවුනගේ මාර්ගයෙන් ඒවා සංවර්ධනය කෙරේ.

4.4 අවිධිමත් ඉඩම් ගනුදෙනු හමුවේ ඇති අභියෝග

ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයන් හි පවත්නා අවිධිමත් ගනුදෙනු මත සිදු කරන්නා වූ අඳ, බදු, උකස් ආදී වූ නීත්‍යානුකූල නො වන බුක්තික්‍රම හේතුවෙන් ජනපද ඉඩම්වල සැබෑ අයිතිකරුවන් වූ ඉඩම්ලාභීන් ඉඩම් අහිමි වූ, ජීවන මාර්ග නොමැති දුප්පතුන් එසේත් නැත්නම් තම ඉඩම්වල ම පොහොසත් ඉඩම් හිමියන්ගේ කළමනාකරණය යටතේ කටයුතු කරන අසරණ කම්කරුවන් බවට පත්වීමට ඇති අභියෝගය කෙරෙහි නොයෙක් විද්වතුන්ගේ අවධානය යොමු ව පවතී. මෙම අභියෝගයෙ හි යථා ස්වරූපය පිළිබඳ ව මෙම ලිපිය මඟින් තවදුරටත් ගැඹුරින් විමසා බැලීමට උත්සාහ කෙරිණි.

මහවැලි ව්‍යාපාරය ආශ්‍රයෙන් සිදුකළ අධ්‍යයන ගණනාවක් විමර්ශනය කිරීම තුළින් අදහස් දක්වන වික්‍රමසේකර (1985) අඳ, බදු, උකස් ආදී ක්‍රමයන්ට ඉඩම් පිටතට දීම නිසා මෙන් ම ඒ තුළින් ඒවායේ අයිතිය ද අහිමි වන නිසා ඒවා සුළු පිරිසක් කේන්ද්‍ර ගත කරගනිමින් ඒකරාශී (consolidation) වන බවත් ඒ තුළින් ජනපදයන් හි ජනගහනයෙන් එක් කොටසක් වඩාත් දුප්පතුන් වන බවත් පෙන්වා දෙයි. මෙම ලිපිය සඳහා පාදක වූ ක්ෂේත්‍ර අධ්‍යයනය අනුව ද පැහැදිලි වූයේ යම්කිසි ආකාරයකට වගා කිරීම සඳහා ශ්‍රමය, යන්ත්‍ර සූත්‍ර හෝ ඒ සඳහා ආයෝජනය කිරීමේ හැකියාව ඇති අය විසින් ජනපද ඉඩම් හැකි තරම් ලබා ගැනීමට යොමු ව සිටි බව ය. ඒ හේතුවෙන් අදාළ ජනපද යටතේ ලබා දෙනු ලැබූ සාමාන්‍ය ඉඩම් සීමාව ඉක්මවා ගිය ප්‍රමාණයක් එවැනි පුද්ගලයින් වෙත සංකේන්ද්‍රණය වී තිබුණි. අධ්‍යයන නියැදියෙ හි සිටි එකිනෙක ගොවි පවුල් 2006-2007 මහ කන්නය තුළ දී බුක්ති විදි මුළු ඉඩම් ප්‍රමාණය අනුව ඔවුන් විසිර තිබූ ආකාරය වගු අංක 5 මඟින් ඉදිරිපත් කර ඇත. එයට අනුව සමස්ත අධ්‍යයන ප්‍රදේශය තුළ සිටි ගොවි පවුල්වලින් 1% ක් පමණ අක්කර 20 ට වඩා ඉඩම් ප්‍රමාණයක් 1.3% ක් අක්කර 15 ට වැඩි ඉඩම් ප්‍රමාණයක්, 2.6% ක් පමණ අක්කර 10 ට වැඩි හා 9.2% ක් පමණ අක්කර 5 ට වැඩි ඉඩම් ප්‍රමාණයක් බුක්ති විදි බව පෙනී ගියේ ය. අක්කර 5 ක සීමාව

යටතේ ඉඩම් බෙදා දී ඇති පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය හැරුණු කොට අන් කිසිවක විශාල ඉඩම් ප්‍රමාණයන් බෙදා දී නොමැති නිසා අක්කර 5 ට වඩා බුක්ති විඳින සියළු ඉඩම් අන් ජනපදවල පමණක් නොව පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය යටතේත් අවිධිමත් ආකාරයෙන් ඒකරාශී කරන ලද ඉඩම් ලෙස සැලකිය හැකි ය.

එකිනෙක ව්‍යාපාර වෙන වෙනම ගෙන සලකා බලන විට අවිධිමත් බුක්ති ක්‍රම නිසා ජනපද ඉඩම් නීත්‍යානුකූල නො වන ආකාරයට ඒකරාශී වී ඇති ආකාරය තවදුරටත් පැහැදිලි වෙයි (වගු අංක 5). උදාහරණ ලෙස මහවැලි එච් හා කිරිදි ඔය ව්‍යාපාරය යටතේ එක් පවුලක් වෙනුවෙන් බෙදා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 2 1/2 ක් වුවත් අධ්‍යයනයට අනුව මහවැලි ව්‍යාපාරයට අයත් නියැදි ගොවි පවුල්වලින් 42% ක් හා කිරිදිඔය ව්‍යාපාරයට අයත් නියැදි ගොවි පවුල්වලින් 27% ක් බුක්ති විඳින්නේ අක්කර 2 1/2 වඩා වැඩි ප්‍රමාණයේ කුඹුරු ඉඩම් ය. පරාක්‍රම සමුද්‍රය හා උඩවලව ව්‍යාපාර යටතේ පවුලක් වෙනුවෙන් බෙදා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය පිළිවෙළින් අක්කර 5 හා 3 යන සීමාවන් යටතට ගැණුන ද එම ව්‍යාපාරයන්ට අයත් නියැදි ගොවි පවුල්වලින් සියයට 4 ක් හා සියයට 15 ක් බුක්ති විඳිනු ලබන්නේ පිළිවෙළින් අක්කර 5 ට හා අක්කර 3 ට වඩා වැඩි වූ ඉඩම් ප්‍රමාණයන් ය.

වගු අංක 05 : ඒ ඒ ව්‍යාපාරය යටතේ වූ නියැදි ගොවි පවුල් 2006-2007 මහ කන්නය තුළ දී බුක්ති විඳි කුඹුරු ඉඩම් ප්‍රමාණය අනුව විසිර සිටි ආකාරය

වගා කරන කුඹුරු ප්‍රමාණය (අක්කර)	ජනපදය				එකතුව %
	මහවැලි එච් %	පරාක්‍රම සමුද්‍ර %	උඩවලව %	කිරිදිඔය %	
<=0.5	4.9	1.5	6.3	11.5	6.5
0.5 >= 1.0	13.9	9.5	28.5	12.6	16.2
1.0 >= 1.5	15.3	8.8	8.2	15.2	12.1
1.5 >= 2.0	6.9	7.3	24.1	9.4	12.1
2.0 >= 2.5	25.7	8.8	8.2	30.9	19.2
2.5 >= 3.0	3.5	8.0	9.5	0.5	5.1
3.0 >= 5.0	25.0	31.4	11.4	14.1	19.7
5.0 >= 10.0	4.2	15.3	3.8	4.2	6.5
10.0 >= 15.0	0.7	5.1	0.0	0.5	1.4
15.0 >= 20.0	0.0	2.2	0.0	0.0	0.5
20.0 <	0.0	5.1	0.0	1.0	0.8
එකතුව	100	100	100	100	100

තවදුරටත් දත්ත විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලි වූයේ අවිධිමත් ලෙස පුද්ගලයන් වටා සංකේන්ද්‍රණය වූ ඉඩම්වලින් වැඩි ප්‍රතිශතයක් එසේ සංකේන්ද්‍රණය වී ඇත්තේ ඉඩම් බද්දට හා උකසට ගැනීම නිසා බව ය. උදාහරණ ලෙස සමස්ත අධ්‍යයන ප්‍රදේශය තුළ අක්කර 20 ට වඩා ඉඩම් බුක්ති විඳි අයගෙන් 100% ක් ම බුක්ති විඳින ලද්දේ මුදල් බද්දට ගත් ඉඩම් ය. අක්කර 15-20 අතර ප්‍රමාණයක් ඉඩම් බුක්ති විඳි නියැදි ගොවි පවුල්වලින් සියයට 33 ක් එසේ මුදල් බද්දට ගැනීමෙන් හා සියයට 67 ක් වී බද්දට ගැනීමෙන් එම ඉඩම් ප්‍රමාණය ඒකරාශී කරගෙන තිබුණි. ඒ ආකාරයට ම අක්කර 10-15 අතර ප්‍රමාණයක් ඉඩම් බුක්ති විඳි අයගෙන් සියයට 40 ක් මුදල් බද්දට ගැනීමෙනුත් 60% ක් වී බද්දට ගැනීමෙනුත් එම මුළු ඉඩම් ප්‍රමාණයට ඒකරාශී කරගෙන තිබුණි. අක්කර 5-10 අතර ප්‍රමාණයක ඉඩම් බුක්ති විඳි අයගෙන් සියයට 74 ක් වැනි විශාල ප්‍රමාණයක් වී බද්දට ගැනීමෙනුත් 13% ක් උකසට ගැනීමෙනුත් ඉතා සුළු ප්‍රමාණයක් (13% ක්) තමන්ට අයත් නීත්‍යානුකූල ඉඩම් හා මිලට ගත් ඉඩම් භාවිතයෙනුත් එම ඉඩම් ප්‍රමාණය ඒකරාශී කරගෙන තිබුණි. තවදුරටත් විමසා බැලීමේ දී පැහැදිලි වූයේ සමස්ත අධ්‍යයන ප්‍රදේශය තුළ ම අක්කර 3-5 අතර ඉඩම් ප්‍රමාණයක් බුක්ති විඳි අයගෙනුත් 1% ක් තරම් වූ ප්‍රමාණයක් මුදල් බද්දට හා 41% ක් තරම් වූ ප්‍රමාණයක් වී බද්දට ගැනීමෙනුත් සියයට 5 ක් තරම් වූ ප්‍රමාණයක් උකසට ගැනීමෙනුත් ලබාගත් ඉඩම් භාවිතා කළ බව ය. මෙම ඉඩම් ප්‍රමාණය භාවිතා කළ අයගෙන් 11% ක් තරම් වූ ප්‍රමාණයක් මිලට ගත් ඉඩම් ඒ සඳහා යොදා ගෙන තිබුණි. මීට අමතර ව මෙම කාණ්ඩය භාවිතා කළ ඉඩම් අතර නීත්‍යානුකූල ඉඩම් ද විය.

ඉහත දැක් වූ පරිදි බදු හා උකස් ආදී අවිධිමත් ආකාරයේ ඉඩම් ගනුදෙනු නිසා සුළු පිරිසක් වෙත යම් ඉඩම් ප්‍රමාණයක් සංකේන්ද්‍රණය වීමක් සිදු වූව ද නියැදි ගොවීන් වගා කළ ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් තවමත් ඉතා කුඩා ඉඩම් බව ඉහත දැක්වූ වගු අංක 5 මඟින් ඉදිරිපත් කෙරෙන සංඛ්‍යා ලේඛන අනුව පෙනී යයි. එම වගුවට අනුව ජනපදවල ඉඩම් කැබලි කළ හැකි අවම සීමාව වූ අක්කර 1 කට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් වගා කළ ගොවිහු සමස්ත අධ්‍යයන ප්‍රදේශය තුළ සියයට 23 ක් සිටියහ. ආරම්භ කර වසර 50 කට ආසන්න කාලයක් ගත වී ඇති උඩවලව ජනපදය තුළ ඔවුන්ගේ ප්‍රමාණය සියයට 35 ක් විය. මීට වසර 60 කටත් ඉහත දී ආරම්භයේ විශාල කුඹුරු ප්‍රමාණයක් (අක්කර 5ක්) බෙදා දී ඇති පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය යටතේ වාර්තා වූ එවැනි ඉඩම් වගා කරන්නන්ගේ ප්‍රතිශතය සියයට 11 ක් තරම් අඩු ප්‍රමාණයකි. තව ද මහවැලි එච් හා කිරිඳිඔය ව්‍යාපාරය යටතේ බෙදා දී ඇත්තේ අක්කර 2 ක් වූ කුඹුරු ප්‍රමාණයක් නිසා ඒවා නීතියට අනුව අඩුම වශයෙන් කොටස් දෙකකට බෙදීම හෝ අනු කොටස් කිරීම කෙසේවත් කළ නො හැකි වූව ද ඒවා බෙහෙවින් කොටස් වී ඇති බව අධ්‍යයන තොරතුරු (වගු අංක 05) අනුව පෙනී යයි. එසේ කොටස් කිරීම හේතුවෙන් මහවැලි එච් බල ප්‍රදේශය තුළ වගා කරන ගොවීන්ගෙන් සියයට 18 ක් ද කිරිඳිඔය ව්‍යාපාරය යටතේ වගා කරන ගොවීන්ගෙන් සියයට 24 ක් ද අක්කර 01 හෝ ඊට වඩා අඩු ප්‍රමාණයක් ඉඩම් පරිහරණය කරන්නන් ය. කෙසේ වෙතත් සමස්ත අධ්‍යයන ප්‍රදේශයේ ම සිටි නියැදි ගොවීන්ගෙන් සියයට 66 ක් ම මෑතකාලීන ජනපද යටතේ බෙදා දුන් සාමාන්‍ය කුඹුරු ඉඩම් ප්‍රමාණය වූ අක්කර 2 හෝ ඊට වඩා කුඩා ඉඩම් වගා කිරීමෙන් ජනපද ඉඩම් සුළු පිරිසක් අතට මහා පරිමාණයෙන් සංකේන්ද්‍රණය වීමක් සිදු

වී නොමැති බව පැහැදිලි විය. මෙසේ වගා කරන ඉඩම් ප්‍රමාණය කුඩාවීම සඳහා ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ කලින් ද සඳහන් කළ පරිදි පාරම්පරික ගම්වල පවතින්නාක් මෙන් ජනපද ඉඩම් හි පාරම්පරික ඉඩම් බුක්ති ක්‍රමයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් ජනපදයන්ට නීත්‍යානුකූල ව හඳුන්වා දුන් ඉඩම් බුක්ති ක්‍රම කෘතීම ආකාරයක් ගන්නා බවත් සියළු පවුල්වලට මුල දී සම සමව දුන් ඉඩම් අයිතිය පසුව අසමාන බවකට පත්වන බවක් පෙන්වා දෙයි (වනිශරත්න, 1995).

වගා කළ හැකි මිල මුදල් ඇති කණ්ඩායමක් අතට ඉඩම් පත්වීම තුළ මහවැලි ඇතුළු ජනපද ව්‍යාපාරයන් හි එකිනෙකට වෙනස් වූ ශක්තිමත් බලසම්පන්න කණ්ඩායම් හා කිසිදු බලයක් නොමැති කිසිවක් කරකියා ගත නො හැකි ජානපදිකයන් පිරිසකගේ පැවැත්ම කැපීපෙනෙන ලක්ෂණයක් බවට පත් වී ඇති බව මහවැලි ප්‍රදේශයන් හි වී වගාවේ හි නිරත සුළු ගොවීන්ගේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය පිළිබඳව අධ්‍යයනයක් ඇසුරින් සිරිවර්ධන, එස්. (දාතම නොමැති) පැහැදිලි කරයි. එහෙත් මෙම ලිපිය සඳහා පදනම් කරගත් අධ්‍යයනය යටතේ රැස්කරන ලද තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ ජනපදයන් හි ඉඩම් අන් අයට පවරන්නන් හා ඒවා වගාව සඳහා ලබා ගන්නන්ගේ ස්වභාවය ඉහත දැක්වූවාට වඩා වෙනස් වූ ස්වභාවයක් ගනිමින් පවතින බව ය. එනම් ඉඩම් පවරන්නන් වඩාත් හොඳ සමාජ තත්ත්වයකත් ඉඩම් ලබා ගන්නන් ඊට වඩා අඩු සමාජ තත්ත්වයකත් පසුවන බව යි.

පවත්නා සමාජ හා ආර්ථික තත්ත්වයන් හමුවේ දේපළ හා ධන සම්පත් ඇති අය තවදුරටත් ජනපද ඉඩම් ඒකරාශී කරගනිමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙ හි කරනු ලබන ආයෝජන වෙනුවට ඔවුන් වෙනත් ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කර ඇති බවක් පෙන්නුම් කරයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙ හි ආයෝජනය කිරීම එතරම් ආකර්ෂණීය නො වීමත් මේ කෙරෙහි මූලික ව ම බලපා ඇති කාරණයකි. මේ නිසා අධ්‍යයනයෙ හි තොරතුරු මඟින් එළිදැක්වෙන්නේ වඩාත් දුප්පතුන්ගේ ඉඩම් පොහොසත් අය වෙත ඒකරාශී වීමට වඩා පොහොසතුන්ගේ ඉඩම් දුප්පත් අය වෙත ඒකරාශී වන ප්‍රවණතාවකි. උදාහරණ ලෙස අඳ, බදු, උකස් ආදී වූ අවිධිමත් ක්‍රම යටතේ තම ඉඩම් වෙනත් අයට ලබාදුන් අය අතර සමෘද්ධිලාභීන් වැනි අඩු ආදායම් ලබන්නන් 3% ක් පමණ සිටි අතර අවිධිමත් ආකාරයට වගාව සඳහා ඉඩම් ලබා ගන්නන් අතර සමෘද්ධිලාභීන් 12% ක් එනම් ඊට වඩා වැඩි ප්‍රමාණයක් සිටීම දැක්විය හැක. එසේ ම ඉඩම් ලබාදුන් අය අතර 27% ක් ම දළ වාර්ෂික අදායම ලෙස රු.2,40,000 ඉක්මවා ගිය මුදලක් ඉපයූ අතර ඉඩම් ලබා ගත්තවුන් අතර එබඳු ඉහළ ආදායම් මට්ටමක සිටියේ 19% ක් පමණි. ඉඩම් ලබා දුන්නවුන්ගේ පවුල්වල රැකියාවන් හි නිරත වැඩි ප්‍රමාණයක් එනම් 61% ක් කෘෂිකර්මයෙන් පිටස්තර වැටුප් ලබන රැකියාවන් හි ද 24% ක් කෘෂිකර්මයෙන් පිටස්තර පෞද්ගලික අංශයේ රැකියාවන් හි හා ස්වයං රැකියාවන් හි ද නිරත වූහ. ඉඩම් ලබා ගත්තවුන්ගේ පවුල්වල රැකියාවන් හි නිරත අයගෙන් වැඩි ප්‍රමාණයක් ගොවිතැනෙ හි නිරත වූ බවක් (ඉන් 54% ක්) දැකිය හැකි විය. වී වගාවේ අධික නිෂ්පාදන වියදම නිසා ආකර්ෂණීය ආදායම් ලබන කටයුත්තක් නො වීම විශේෂයෙන් ම ගොවිතැනෙන් පිටස්තර රැකියාවන් හි නිරත වූවන් තම ඉඩම් පිටස්තර අයට බදුදීම සඳහා හේතු කර වූ ප්‍රධාන කාරණාවක් විය. එහෙත් බෙහෙවින් ශ්‍රමය ඇති දුප්පත් පවුල්වලට තම

පවුල්වල ඇති ශ්‍රමය වඩාත් කාර්යක්ෂම ලෙස භාවිතයට ගනිමින් හා නවත් උපක්‍රම අනුගමනය කිරීමෙන් වී වගා කර අත් අයට වඩා වැඩි ප්‍රතිලාභයක් ලැබීමට හැකි වූ නිසා ඔවුන් විශේෂයෙන් ම වී බදු ක්‍රමය යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා වඩාත් පෙළඹී ඇත. මෙය වී බදු ක්‍රමය යටතේ ඇති ඉඩම් ප්‍රමාණය ප්‍රබල ලෙස වැඩි වීමට හේතු වූ කාරණයක් වී ඇත. ඉඩම් ලබා දුන්නවුන් හා ලබා ගන්නවුන්ගේ පවුල්වල ඇති ශ්‍රමය ඇති නැති බව පිළිබඳ ව විමසා බැලීමෙන් මෙය තවදුරටත් පැහැදිලි වේ. ඉඩම් ලබාදුන් පවුල්වලින් 14% ක ශ්‍රම බලකායට අයත් කිසිදු සාමාජිකයකු නො සිටි අතර 38% ක එක් අයෙකු පමණක් සිටියේ ය. 26% ක සාමාජිකයින් තිදෙනෙකු පමණක් සිටියේ ය. එහෙත් ඉඩම් ලබාගත් පවුල්වලින් 35% ක තිදෙනකු ද 16% ක 4 ත් 6 ත් අතර ප්‍රමාණයක් ද සිටියහ. සිද්ධි අධ්‍යයන අංක 3 මඟින් ද මේ තත්ත්වය තවදුරටත් පැහැදිලි වෙයි.

සිද්ධි අධ්‍යයන : 03

පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරයේ අභයපුර ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ අභයපුර කෘ.ප.නි.ස වසමෙ හි පදිංචි ඩබ්ලිව්. පී. ඩේවිඩ් තමන්ට හිමි ඉඩම්වලට අමතර ව උකසට ගත් ඉඩම් තම පවුලේ ශ්‍රමය හා ට්‍රැක්ටර් ආදී උපකරණත් පිට ප්‍රදේශවලින් අඩු මුදලට ලබාගත් ශ්‍රමයත් ඉතා සූක්ෂම ලෙස භාවිතා කරමින් වී වගාව ලාභදායී ලෙස සිදු කරන්නා වූ ගොවියෙකි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයෙ හි සිටි විශ්‍රාම යනවිට තම පියාට ලැබුණු අක්කර 5 න් පවුලේ සිටි සහෝදරයින් අතර බෙදූ විට නීත්‍යානුකූල ව තමන්ට ලැබුණු අක්කර 1 1/2 ට අමතර ව නීත්‍යානුකූල බලපත්‍ර හිමි රක්ෂිතයේ පිහිටි අක්කර 1 ක ප්‍රමාණයක් ද උකසට ගත් අක්කර 1 ක ඉඩමක් ද ඔහු වගා කරයි. ඔහු සතු ව රෝද දෙකේ අත් ට්‍රැක්ටරයක් ඇති අතර වගා කටයුතු සඳහා එය භාවිතා කෙරේ. ඔහුට අමතර ව භාර්යාව හා දරුවන් දෙදෙනා ද උපරිම අන්දමින් වී වගා කටයුතු සඳහා ශ්‍රමය වැය කරයි. ඔහු සතු ව රෝද දෙකේ අත් ට්‍රැක්ටරයක් ඇති අතර වගා කටයුතු සඳහා එය භාවිතා කෙරේ. තමන්ට අමතර ව භාර්යාව හා දරුවන් දෙදෙනා ද (වයස අවු. 22 ගැහැනු හා වයස අවු. 18 පිරිමි) උපරිම අන්දමින් වී වගා කටයුතු සඳහා ශ්‍රමය වැය කරති. ප්‍රදේශයේ ශ්‍රමය සඳහා දිනකට අයෙකුට රු.450 ක් ගෙවීමට සිදුවන නිසා තම පියාගේ ගම් ප්‍රදේශයෙන් රු.350 ක් වැනි අඩු මුදලක් ගෙවීම සඳහා කම්කරුවන් ගෙනැවිත් නිවසේ රඳවාගෙන සේවය ලබා ගනී. මීට අමතර ව පියාගේ හා මවගේ ගම්වල සිටින ඥාතීන් ද ගොයම් කැපීම වැනි අවස්ථාවල දී සහභාගී කරවාගෙන වියදමකින් තොරව ඒවා සම්පූර්ණ කරගනී.

ජනපද ව්‍යාපාරයන් හි අවිධිමත් ඉඩම් ගනුදෙනු නිසා වන සමාජ විපර්යාසයන් සම්බන්ධයෙන් අදහස් දක්වන අබේසේකර (1985), එම ක්‍රියාවලිය නිසා එම ප්‍රදේශයන් හි සමාජය ඇති හා නැතියවුන් ලෙස දෙපසට ගොනු වීමත් තවදුරටත් ඉඩම් හිමි දුප්පත්

ගොවින් තම ඉඩම් ලබාදුන් කෘෂි ආයෝජකයින්ගේ කම්කරුවන් බවට පත්ව (proletarianisation) තම ඉඩම්වල ම වැඩ කරන තත්ත්වයට පත්වීමත් පිළිබඳ ව සඳහන් කර ඇත. එහෙත් වර්තමානයෙ හි වැඩි ඉඩම් ප්‍රමාණයක් අච්චිමත් ලෙස පිටතට දී ඇත්තේ වී බදු ක්‍රමය යටතේ වන අතර එසේ දීමට වඩාත් මූලික හේතූන් වී ඇත්තේ වී වගාව ලාබදායීව කරගෙන යාමට ඇති අපහසුව, ජනපදය තුළ පදිංචිව නො සිටීම හා වෙනත් රැකියාවන් හි නිරතව සිටීම වැනි කරුණු ය. වී බදු ක්‍රමයට ඉඩම් ලබාදී ඇති බොහොමයක් පවුල් ගොවිතැනින් පිටස්තර වැටුප් ලබන රැකියා හා වෙනත් මාර්ගවලින් සැලකිය යුතු ආදායමක් ලබන්නන් මෙන් ම තවදුරටත් ගොවිතැනෙ හි නො යෙදුණු අය නිසාත් ඉඩම් ලබාගෙන ඇතියවුන් බොහොමයක් මොවුනටත් වඩා අඩු සමාජ තත්ත්වයක් හිමි සාමාන්‍ය හෝ දුප්පත් අය නිසාත් කලින් දැක්වූ ආකාරයට ඉඩම් හිමි ජනපදලාභීන් තම ඉඩම් ලබාදුන් ගොවින්ගේ කම්කරුවන් බවට පත්වීමට ඇති ඉඩප්‍රස්ථා ඉතා සීමිත බව අධ්‍යයනය යටතේ කළ නිරීක්ෂණයන්ගෙන් පැහැදිලි විය.

එසේ වුවත් මුදල් බදු හා උකස් ක්‍රමයට ඉඩම් ලබාගත් වැඩි සම්පත් ප්‍රමාණයක් හිමි මෝල් හිමියන්, සිල්ලර වෙළෙඳුන්, කෘමිනාශක හා පොහොර වෙළෙඳුන්, නිලධාරීන් වැනි සීමිත පිරිසක් තමන්ට ඉඩම් ලබාදුන් ජනපද ගොවින් සමඟ පවත්වනු ලබන අනුග්‍රාහක සේවාදායක සම්බන්ධතාවය අනුව ජනපද ගොවින් තම ඉඩම් ලබාගත් ගොවින්ගේ/ආයෝජකයින්ගේ කම්කරුවන් බවට පත්ව ඇති අවස්ථා අත්දැකීමට හැක. විශේෂයෙන් ම මුදල් බද්දට ඉඩම් ලබා ගන්නා ආයෝජකයෝ ඉඩමේ කෙසෙල්, ගස්ලබු, සෝයා බෝංචි, බඩ ඉරිඟු, මිරිස්, බී ළූනු වැනි වාණිජමය වටිනාකමක් ඇති බෝග වගාව සඳහා භාවිතා කරති. ඒ සඳහා අධික ශ්‍රමය අවශ්‍ය වන අතර ඉඩම් අයිතිකරු ගොවින් ද තම ශ්‍රමය ඒ සඳහා අලෙවි කරන අවස්ථා දැකිය හැක. එහෙත් මෙවැනි තත්ත්වයක් අත්දැකිය හැකි වූයේ ඉතා සුළු වශයෙනි. වර්තමානයෙ හි ඉඩම් බදු දෙන වැඩි පිරිසක් පවුලේ ශ්‍රම හිඟකම නිසා හෝ තමා ඇතුළු පවුලේ අනෙකුත් අය වෙනත් රැකියා මාර්ගයන් හි නියුතුව සිටින නිසා හෝ එසේ සිදු කරන නිසා ඔවුන්ට තවදුරටත් කම්කරුවන් ලෙස කටයුතු කිරීමට හැකියාවක් නොමැත.

අච්චිමත් ආකාරයට ජානපදිකයින්ගේ ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක්ව ඇති ප්‍රධාන අභියෝගය වන්නේ එම ඉඩම් ජානපදිකයින්ගේ අයිතියෙන් ගිලිහී යාම යි. විශේෂයෙන් ම ඉඩම් උකස් කිරීම නිසා ඒවා ජානපදිකයින්ගේ අයිතියෙන් ගිලිහී යාම (වික්‍රමසේකර, 1985) සම්බන්ධයෙනුත් නිෂ්පාදන මාර්ග ලෙස පවත්නා එවැනි ඉඩම් සමඟ ජානපදිකයින්ගේ සබඳතා අත්හැරීම (divorced) (අබේසේකර, 1985) සම්බන්ධයෙනුත් මීට පෙර මේ විෂය සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඇති සමාජ විද්‍යාඥයින් විසින් අදහස් දක්වා ඇත. මෙම අධ්‍යයනය යටතේ සිදු කරනු ලැබූ සිද්ධි අධ්‍යයනයන්ගෙන් ද පැහැදිලි වූයේ අසනීප හා වගා කටයුතු සඳහා අයෝජනය කිරීමට මුදල් අවශ්‍ය වීම වැනි හදිසි කාර්යයන් සඳහා ඉඩම්ලාභී ජනපද ගොවින් තම ඉඩම් උකස් කර වෙළෙඳුන්, කඩ හිමියන් හා මෝල් හිමියන් වැනි අයගෙන් මුදල් ලබා ගන්නා නමුත් සමහර අවස්ථාවන් හි දී ගිවිසගත් පරිදි නියමිත කාලයට ඒවා ගෙවා දැමීමට නො හැකි වීම හේතුවෙන් එම ඉඩම්වල අයිතිය ණයට මුදල් ලබාදුන් පුද්ගලයන්ගේ අතට යන බව යි. සිද්ධි අධ්‍යයන 4 න් දැක්වෙන්නේ ඒ සඳහා වූ කදිම උදාහරණයකි.

සිද්ධි අධ්‍යයන : 04

මහවැලි එච් කලාපයට අයත් කැලේගම කෘ.ප.නි.ස. වසමෙ හි පදිංචි සරත් විජේසිංහ එම ජනපදය යටතේ 1980 ගණන්වල මුල් භාගයේ පදිංචි කරවන ලද ගොවි පවුලකට අයත් දෙවන පරම්පරාවෙ හි සාමාජිකයෙකි. දෙමාපියන්ගේ ජනපද ඉඩම ඔහු හා ඔහුගේ සහෝදරියක අතර දෙකට බෙදාගත් අතර ඔහුගේ කොටස 1996 දී තම භාර්යාව විදේශ රැකියාවකට යැවීම සඳහා රු.6000 කට ජනපදයෙ හි ම පදිංචි තවත් ගොවියෙකුට උකස් කර ඇත. විදේශ ගතවන ලද භාර්යාව නැවත ආපසු නො පැමිණීම නිසා ඔහු අසරණ වී ඇති අතර රැකියාවක් ද නො කරන නිසා ඉඩම නියමිත අවස්ථාවල දී බේරාගැනීමට නො හැකි වී ඇති බැවින් නැවතත් රු.20,000 ක් ලබාගෙන එම පුද්ගලයාටම එය උකස් කර කලින් ලබාගත් මුදල ගෙවා ඇත. ඇඳුම් සකසනු ලබන කර්මාන්ත ශාලාවක සේවය කරන තැනැත්තියක සමඟ දෙවන වරටත් විවාහ වූ ඔහු කුලී නිවසක පදිංචිව සිටී යි. තම පියාට අයත් අක්කර 1/2 ක් ගොඩ වී ඉඩම පමණක් ඔහුට නිරවුල් ව අයත් ව තිබේ. තවදුරටත් රැකියාවක් නොමැතිව සිටින ඔහුට ඉඩම නිදහස් කරගැන්ම අපහසු නිසා තුන්වන වරටත් එය කලින් උකස් කළ අයට ම රු.100,000 කට උකස් කර ලබාගත් මුදලින් කලින් ලබාගත් රු.20,000 ගෙවා ඇත. තවදුරටත් ඉඩම මුළුමනින් ම මුදා ගැනීම සඳහා ඔහුට හැකියාවක් ඇති බවක් පෙනෙන්නට නොමැති නිසා ඉඩම ඔහුට මුළුමනින් ම නො ලැබී යාමට ඉඩ ඇත.

අධ්‍යයනය යටතේ තවදුරටත් කරනු ලැබූ සොයාබැලීම්වලින් පෙනී ගියේ ජානපදිකයින් විසින් උකස් කරන ලද ඉඩම් සඳහා ලබාගත් මුදල් නියමිත අවස්ථාවන් හි දී ගෙවා දැමිය නො හැකි වුව ද ඒවා උකස් ලබාගත් අයට සින්න වීමට ඇති අවස්ථාව ඉතා විරල බව යි. තම ඉඩම් අහිමි වීමට ඇති අභියෝගයෙන් ජය ගැනීම සඳහා ජානපදිකයෝ විවිධ උපක්‍රම යොදති. ඒ සඳහා අනුගමනය කරනු ලබන ප්‍රධාන උපක්‍රමය වන්නේ ණය ගෙවීමට නියමිත කාලයේ දී එම ඉඩම කලින් උකස් මිලට ම හෝ ඊට වඩා වැඩි මුදලකට වෙනත් අයෙකුට උකස් කර එම මුදලින් කලින් ලබාගත් ණය මුදල ගෙවා ඉඩම උකසින් බේරා ගැනීම යි. ඇතැම් අවස්ථාවන් හි දී කලින් ඉඩම උකස් කළ පුද්ගලයාට ම ඊට වඩා වැඩි මුදලකට එය නැවතත් උකස් කර කලින් ලබාගත් ණය පියවීමට ද ක්‍රියා කරයි. මෙවන් අවස්ථාවන් හි දී ඉඩම් අයිතිකරු ගෙවා ගත නො හැකි මට්ටමකට ණය වීමෙන් ඉදිරියේ දී ඉඩම තමන්ටම අයත් කරගැනීමට අවස්ථාව සැලසෙන නිසා ඇතැම් ව්‍යාපාරිකයෝ තමන් උකස් ගත් ඉඩම්වල අයිතිකරුවන්ට තවදුරටත් ණය දීම සඳහා කැමැත්තක් දක්වති. මෙසේ කීප වතාවක් උකස් කිරීමත් සමඟ තමන්ට ගෙවාගත නො හැකි මුදලක් දක්වා එය වර්ධනය වන අවස්ථාවන් හි දී ඉඩමේ වටිනාකමට සරිලන පරිදි තවත් සුළු මුදලක් ඉල්ලාගෙන ඉඩමේ අයිතිය උකස් ලබාගත් අයටම පවරන අවස්ථා ද නිරීක්ෂණය කළ හැකි විය.

ගොවි ජනපද ආරම්භ කරනු ලැබූ අවධියේ සිට සිදු කර ඇති සමාජ – ආර්ථික පර්යේෂණවලට අනුව අවිධිමත් ලෙස විවිධ භුක්ති ක්‍රම යටතේ ඉඩම් වෙනත් අයට පවරා දීම සැලකිය යුතු මට්ටමකින් සිදු කර ඇති අතර දැනටත් සිදු කෙරෙමින් පවතී. ඒ අනුව මේ වන විට බොහෝ ජනපද ඉඩම් ජානපදිකයින්ගේ අයිතියෙන් හා පරිපාලනයෙන් ගිලිහී පැවතිය යුතු ය. එහෙත් ජනපද ඉඩම් විවිධ අවිධිමත් භුක්ති ක්‍රම යටතේ වෙනත් අයගේ පාලනයට පත් වුව ද ඒවා තවදුරටත් ජානපදිකයින්ගේ අයිතිය හා බලයට යටත්ව දිගින් දිගට ම පවතින බවට විවිධ සාධක ඇත. මහවැලි එච් ප්‍රදේශයෙ හි මතුවෙමින් පවත්නා වූ ආර්ථික අසමානතාව හා සැඟවුණු භුක්ති ක්‍රමයන් හි ස්වභාවයන් සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරනු ලබන සිරිවර්ධන (1981) ට අනුව ජානපදිකයින් තවදුරටත් ඉඩම්වල අයිතිකරුවන් ලෙස සිටින නිසාත් ඔවුන් සම්පූර්ණයෙන් ම නිෂ්පාදන අයිතියෙන් වෙන්කර නොමැති නිසාත් ඉඩම් කැබලි එකතු කර ඇති බවට හෝ වැඩි පිරිසක් ඉඩම් නොමැති කම්කරුවන් බවට පත් වී ඇති ආකාරයත් හෝ ජනපදය තුළින් දැක ගැනීමට අපහසු ය. මෙවැනි තත්ත්වයක් ඇතිවීම සඳහා හේතු වී ඇත්තේ අඳ බදු, උකස් යනාදී ක්‍රම මඟින් ඒකරාශී කරන ලද ඉඩම්වලට හෝ ඒ ක්‍රම මඟින් අයත් කරගත්තා ඉඩම් සඳහා නීතිමය අයිතියක් ලබාදීමට රජය ඉදිරිපත් නො වීම යි. එවැනි ඒකරාශී කරන ලද ඉඩම් ස්ථිර ලෙස සංවර්ධනය සඳහා මැදිහත් වීමේ දී විවිධ ගැටළු මතුවීම හේතුවෙන් ඉඩම් ඒකරාශී කළ අය මහත් අධෛර්යයට පත්වන බැව් කිරිදිඹය ව්‍යාපාරයෙ හි ගොවි මහතෙකු වූ එච්.කේ. චන්ද්‍රදාස මහතා සම්බන්ධයෙන් කරනු ලැබූ සිද්ධි අධ්‍යයනයෙන් (සිද්ධි අධ්‍යයන : 05) පැහැදිලි වෙයි. එසේ ස්ථිර ලෙස සංවර්ධනය කිරීමේ දී මතු වන ගැටළු නිසා ඔවුහු තවදුරටත් ඉඩම් ඒකරාශී කිරීමෙන් වැළකෙති.

සිද්ධි අධ්‍යයන : 05

කිරිදිඹය ව්‍යාපාරයට අයත් වම් ඉවුරෙ හි කුඩා ගම්මාන දෙකෙ හි පදිංචි එච්.කේ. චන්ද්‍රදාස, අත ශතයක් හෝ නොමැතිව ජනපදයට පැමිණ අද, බද්ද, උකස් ආදී ක්‍රමයන්ට ඉඩම් ලබාගෙන වගා කටයුතු කර මහත් දියුණුවක් අත්කරගත් වයස අවු. 45 ක් වූ ගොවියෙකි. අද ක්‍රමයට ඉඩම් ලබා ගැනීම මඟින් වී වගාවෙන් වගා කටයුතු ඇරඹූ ඔහු රු.60,000, 80,000 පමණක් නොව රු. 200,000 දක්වා වූ මුදල් ප්‍රමාණයක් ගෙවමින් කෙසෙල් වගාව සඳහා ඉඩම් ලබා ගැන්මෙන් හා ඒවා සාර්ථක ව වගා කිරීමෙන් ඉහළ අදායමක් ලබා ගැන්මට සමත් ව ඇත. ඊට අමතර ව ඔහු මුදලට ජනපද ඉඩම් ද ට්‍රැක්ටර් ආදී කෘෂි උපකරණ ද ලබා ගැන්මට යොමු ව ඇත. ඒ අනුව මිල දී ගත් අක්කර 2 ඉඩම් කැබලි දෙකක් ද බද්දට ගත් ඉඩම් කැබලි 10 ක් ද වගා කරන අතර කුඩා ට්‍රැක්ටරයක් ද, ලොකු ට්‍රැක්ටයක් ද සංයුක්ත කොළ මඩින යන්ත්‍රයක් ද ඔහු සතු ය. මෙමඟින් ඔහුට ලැබෙන මාසික ආදායම රු.10,000 ඉක්මවන අතර තමන් සතු ඉතා නවීන නිවසක් ද ඇත. විවාහක ගොවි මහතෙකු ලෙස වඩාත් සුඛෝපබෝගී ජීවිතයක් ගත කරනු ලබන ඔහුට අවුරුදු 14 සහ 12 යන වයස්වල දුවකු හා පුතෙක් ද සිටිති.

නීත්‍යානුකූලව පිළිගත් ක්‍රමයට පිටස්තරව ලබාගෙන ඇති ඉඩම් සංවර්ධනය කිරීම ඔහුට මහත් ගැටළුසහගත තත්ත්වයකි. ඔහු මිලට ගත් ගෙවත්ත සහිත ඉඩමේ වී මෝලක් සවිකර තිබුන ද එය තවදුරටත් දියුණු කිරීමෙන් ප්‍රතිඵලයක් අත්වේද යන්න පිළිබඳ සැකයෙන් ඔහු පෙළෙයි. නීත්‍යානුකූල ජනපදලාභීන් හැරගිය ඉඩම් ඉදිරියේ දී වෙනත් අයට කච්චරි ක්‍රමයට ලබාදීමට කටයුතු කරන බවත් ආරංචි වීම නිසා විකිණීමට කොතෙකුත් ඉඩම් තිබුන ද ඒවා මිලට ගැන්මට හෝ ලබාගත් ඉඩම් තවදුරටත් දියුණු කිරීමට නො හැකි තත්ත්වයකට ඔහු පත්ව සිටී. ඇත. එම ඉඩම් දියුණු කිරීම සඳහා ණය ලබා ගැන්මට ද නොහැකි තත්ත්වයක පවතී.

අවිධිමත් ලෙස මිල දී ගැනීම නිසා පමණක් නොව අද බද්ද, උකස් ක්‍රමයන්ට ද ලබා ගැනීම නිසා ජනපද ව්‍යාපාරයන් හි එවැනි බොහොමයක් ඉඩම්වල පසෙ හි ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීම හා අදාළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් කිසිවෙකු ඉදිරිපත් නො වන බවට ද මහවැලි එච් ව්‍යාපාරය ඇසුරින් අත්දැකිය හැකි ය (සිරිවර්ධන, 1981). විශේෂයෙන් ම මෙවැනි තත්ත්වයක් ඇතිවන්නේ නීත්‍යානුකූල අයිතිය සුරක්ෂිත වීම මත පමණක්, දිගුකාලීන ආයෝජන ඵලදායීතාවය, ඉඩම්වල තිරසාර බව සඳහා අවශ්‍ය වන ඇළ කානු ශුද්ධ කිරීම, පොහොර යෙදීම හා ගස් වැවීම යන කටයුතු සිදු කරනු ලබන නිසා ය (ඩීනින්ජර්, 2003). මෙම ලිපිය සඳහා පාදක කර ගනු ලැබූ අධ්‍යයනය මඟින් ද අනාවරණය කර ගැන්මට හැකි වූයේ බදු හා උකස් ගන්නන් කුඹුරුවල නියර අලුත්වැඩියා කිරීම හා ඇළ නඩත්තු කිරීම යනාදී වූ දිගුකාලීන ඵලදායිතාවය වෙනුවෙන් වූ කටයුතු සඳහා ආයෝජනය නො කරන බව ය (චන්ද්‍රසිරි, 2010).

5. නිගමනය

ගොවි ජනපද යෝජනා ක්‍රමයන් ආරම්භක අවධියේ දී නීතිරීතීන් හා රෙගුලාසීන් මඟින් ඉඩම්ලාභීන් පදනම් කරගත් අයිතිකාර බුක්ති ක්‍රමය පවත්වා ගැනීමට අවශ්‍ය පදනම දැමුවත් කල්යත් ම විවිධ මිනිස් අවශ්‍යතා හා සමාජ ආර්ථික ප්‍රශ්න, නා නා ප්‍රකාරයේ වූ අවිධිමත් බුක්ති ක්‍රම ඇති කරලීම සඳහා හේතු කාරක වී ඇත. සමාජ අවශ්‍යතා මඟින් ඒවායෙ හි පැවැත්ම සාධාරණීකරණය කරනු ලබන බැවි පෙනෙන්නට ඇති බැවින් තවදුරටත් ඒවා අවිධිමත් ක්‍රම ලෙස පවත්වාගෙන යනු වෙනුවට විධිමත් හා නීතියෙන් පිළිගත් එවා ලෙස පවත්වාගෙන යාමට අවස්ථාව සැලසීම තුළින් ඒවා අවිධිමත් හා නීතියෙන් නො පිළිගත් ඒවා ලෙස පවත්වාගෙන ඒමෙන් වන අයහපත් බලපෑම් නැති කරගත හැකි වනු ඇත.

6. යෝජනා

01. ගොවි ජනපදයන් හි අවිධිමත් යැයි සැලකෙන බුක්ති ක්‍රම සඳහා පිළිගත් කාලසීමාවකට යටත්ව නීතිමය ආවරණය සැලසීම මඟින් ඒවා විධිමත් හා නීතියට අනුකූල ඒවා ලෙස පිළිගැනීමට කටයුතු කිරීම.

02. ඉතා දක්ෂ හා උනන්දු ගොවීන් විසින් හදිසි අවස්ථාවන් හි දී තම කුඹුරු ඉඩම් උකස් කිරීමෙන් ලබාගත් ණය මුදල් ගෙවා ගැනීමට නො හැකි වීමෙන් කුඹුරු අහිමි වීමට ඉඩකඩ ඇති අවස්ථාවන් හි දී සහනදායි ණය ලබා දීමෙන් ඉඩම බේරා ගැනීමට සහයෝගය ලබාදිය යුතු වීම.

ආශ්‍රිත ග්‍රන්ථ

01. Abeysekera, C. (1985), *Capital and Peasant Production; Studies in the Continuity and Discontinuity of Agrarian Structures in Sri Lanka*, Social Scientists Association of Sri Lanka.

02. Chandrsiri, J.K.M.D. (2010), *Impact of Informal Land Transactions in Settlement Schemes in Sri Lanka* (Research Report No. 132), Hector Kobbekaduwa, Agrarian Research and Training Institute, Colombo 07.

03. Department of Land Commissioners (1985), Land Commission Report.

04. Department of Land Commissioners (1986), Progress Report.

05. Ellman, A.O., Ratnaweera, D.de.S., Silva, K.T. and Wickramasinghe, G. (1976), *Land Settlement in Sri Lanka 1840–1975; A Review of the Major Writings on the Subject*, Agrarian Research and Training Institute, Colombo 07.

06. FAO (non dated), *What is Land Tenures Land Tenure and Rural Development : FAO Corporate Document Repository (Online)*, Avaliable: http://www.fao.org (2011/09.28).

07. Siriwardena, S.S.A.L. (undated), *Problems of Assessing Efficiency of Paddy Smallholders in a Mahaweli Settlement.*

08. Siriwardhana, S.S.A.L. (1981), *Emerging Economic Inequalities and Forms of Hidden Tenancy in the Mahaweli H Area*, Monograph, Peoples' Bank Research Department.

09. Wanigaratne, R.D. (1995), *Informal Tenure Conditions in Irrigated Settlements in Sri Lanka: A Review of Empirical Research Evidence*, Land Tenure Center, University of Wisconsin, Madision.

10. Wickramasekera, Piyasiri, (1985), "The Mahaweli Development Programme and the Peasantry" in Abeysekera Charles (edited) Capital and Peasant Production; Studies in the Continuity and Discontinuity of Agrarian Studies in Sri Lanka, Social Scientists Association, p.83-p.139.